# කිතුනු ගී - ඇතුල්වීමේ ගී- 1

## 1 – එව් අප තොස

එව් අප තොස පල කරනට සමිඳු ඉදිරියේ
අප රක්නා නොසැලෙන සල හට ජය ජය වේ
යමු අපි එතුමන් හමුවට ගයා තුති පුදා
සමිඳුන් හට ගී ඔහොයියය නගමු අප මෙදා

ඇතුළු වන්නැ, වැඳ වැටෙන්නැ, බිමට පහත් වී
අපව මැව්ව දෙව්සුරුනට වඳිමු දණ නමා
එතුමෝ වෙති අප පරමත් දෙව්සුරාණ නෝ
අපි වෙමු එතුමන් අත යට රැකෙන බැටළුවෝ

සමිඳෝ වෙති දෙව්සුරු මහබලවතාණ නෝ
සියලු මුරුන්ගේ මහ බල රජ ඉසුරාණෝ
පොළොවේ මහ ගැඹුරු තැන්ද ඇත එතුමන'තේ
මැවුණු මුහුද, පොළොව කඳුද එතුමන් උරුමේ

## 2 – අහස ඔබේ මහිමේ

අහස ඔබේ මහිමේ පළකරයි දෙවියනේ
ගුවන් සතද අත්කම් එතුමන්ගේ වනන්නේ
එක දවසක් තව දිනකට පණිවුඩ දෙන්නේ
රැයෙකැ දැනුම තව රැයකට බෙදා හරින්නේ

අණ පතන් ඔබේ සමිඳුනි හඳ පිනවන්නේ
දහම් මිය ඔබේ සුරිඳුනි ඇස් පහදන්නේ

උඩඟු වනු නොදී ඔබගේ දස්ස රකින්නේ
යට වන්නට ඊට මාව බාර නොදෙන්නේ
එවිටැ දොසින් මිදී ඉන්න මට හැකිවන්නේ
තවද මහා බර පාපෙන් මිදුම ලැබෙන්නේ

## 3 - ගී හඬ නගමින්

ගී හඬ නගමින් තුති ගොස පුදමින්
සමිඳුගෙ මැදුරට යමු තොසිනා

සමිඳුනී සුර සේනාවන්ගේ දෙවිඳුනී
ඔබෙගේ වාසභවනය කොතරම් දශීණියද

මාගේ ආත්මය ඔබ වාසභවනය වෙත ඒමට
නොඉවසිල්ලෙන් බලා සිටින්නේය

ජීවමාන දෙවියන් හට මාගේ ආත්මයත්
ප්‍රීතියෙන් මොර ගසන්නේය

ඔබ තුළ ශක්තිය රඳා ඇති සියල්ලෝ
ප්‍රීතියෙන් පසු වන්නෝය

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට තුති වේවා
දැනුත් සදහටත් මහිමය වේවා

## 4 - ගයව් ගයව්

ගයව් ගයව් සමිඳුන් හට අළුත් ගී ගයව්
සියලු දෙරණ සමිඳාණන් ගීයෙන් පසසව්
ඔවුන් වහන්සේ නමට සෙත් පතා
සමිඳුන් හට කියව් ගීතිකා //

ඔවුන් වහන්සේ නමට සෙත් පතා
සමිඳුන් හට කියව් ගීතකා //

එදිනෙදා එතුම දුන්න උදව් පලකරව්
ජනරුස් හමුවේ එතුමන් මහිමේ දන්නව්
සියලුම ජනතා ඉදිරියේ කියව්
එතුමන් පෑ අරුම පුදුමතා

## 5 – යමු යමු යමු අපි

යමු, යමු, යමු, අපි මැඳුරට සමිඳුන්
පැවැසූ සඳ ඔහු මා අමතා
මගේ හිසින් ගත් ඔවුන්ගෙ එබසින්
මගෙ හදවත පිපුණා //

අපි දැන් එහි වමු ඔබ පා සෙවණේ
ඔබගේ වාසල් දොරටු තුළේ

සැරදේ ජෙරුසලමේ, සැරදේ ජෙරුසලමේ
හෝ
සමිඳුන් නම සඳහා පුදනට තුත් පූජා

## 6 – දෙවිඳු පුදට

දෙවිඳු පුදට පුදසුන වෙත නගම් දෙපා ප්‍රීති වෙමින්
සමිඳු වරම් ලැබ ගන්නටන දෙන්නෑ ආසිරි

අගෙයි කියා සුරකින කිසි දෙයක් ඇත්තේ නෑ
මගෙ හොඳ හිත ඔබට දෙන්ට මම පැමිණෙනවා

මුදල් හදල් වතුපිටි ඈ කිසිම දෙයක් නෑ
ඒ කිසිවක් සමිඳේ ඔබට ඇවැසි කමෙක් නෑ

පවුලක් ලෙස මා අඳිදින පුදසුන හමුවේ
වැඳ වැටිලා ගෙනා පඬුරු ඔබට පුදනවා

## 7 – ජය ජය ජය හඬ

ජය ජය ජය හඬ නංවා ලා
යමු යමු යමු අපි සමිඳු සොයා //

තෙල් මල් පුදලා – පුදසුන තනලා //
හේවිසි වයලා – ගැට බෙර ගසලා //
සක් ගෙඩි පිඹලා

අපි සැම දෙන එක'ටෙක් වීලා
යමු යමු යමු අපි සමිඳු සොයා //
සමිඳුට නිති ජය වේ /// සමිඳුට තුති අත් වේ

සුදු පිලි ඇඳලා – අත් වැල් බැඳලා //
පහන් දරාලා – බැතිත් නැමීලා //
ජය හඬ නගලා
අපි සැම දෙන එක'ටෙක් වීලා
යමු යමු යමු අප සමිඳු සොයා
සමිඳුට නිති ජයවේ //
සමිඳුට තුති අත්වේ

## 8 – අහස පොළොව

අහස පොළොව සිවුපාවුන් ගස් කොළන් මවා
එතුමන්ගේ මහිමෙ නිසා මිනිසා මැව්වා
එතුමන් වඳිමු – එතුමන් ගයමු
රස වදනින් එතුමන් හට අපි ගී ගයමු

එන්න එන්න ඇතුළු වන්න සමිඳු මැඳුරටා
ගී ගයමින් එතුමන්ගේ මහිමය උදෙසා

මිනිසා පව් කරන වගක් දැන ගෙන සිටියා
ජේසු එයින් එවන බවක් පිළිබිඹු කරලා
සමිඳුන් ගයමු – සමිඳුන් වනමු
සමිඳු අපට එව්ව එතුම බැතියෙන් වඳිමු

කුරුසේ යාගයෙන් අපව පවින් ගලවලා
සදා සැපත නැවත අපට හිමි කරදුන්නා
එතුමන් ගයමු – එතුමන් පුදමු
එම යාගය නැවත පුදමු අපි සැම බැතියෙන්

## 9 – සියල් ජනයනේ

සියල් ජනයනේ තොපගේ - දෙව්ඳු වඩින්නේ
නගා ඔහොයියා හඬගා
අත් පොලොසත් දෙව් රජුනට - දෙව්ඳු වඩින්නේ

පිළිගන්නේ තුටු ගොස දී දෙවියන් තොපගේ
අපට ඉහළ වැජැඹෙති ඒ සමිඳරුවාණෝ
බියට සුදුසු තරම් වෙතියි ඔවුන් වහන්සේ
මුළු ලොවටැ මැ ඒ සුරිඳෝ එක නා පල්ලෝ

අපට ඔනැ ලෙසැ රජයන් හිලැ කැරැවූවෝ
විදෙසි දනන් අප පාමුලැ ඔබා නැමෙව්වෝ
උරුම කොටස විසින් අපව වෙසෙසා ගත්තෝ
ජකෝබු පෙළ නම පියකර කෙරේ පැහැදුනෝ

සියල් ලොවේ රජ්ජුරුවෝ පරම දෙව්සුරෝ
එක නිනාදේ හඬ නංවව් ගයා පසස ගී
විදැ දනා කෙරේ පවා රජ වෙති දෙව්ඳෝ
හේලි බැවින් සැදි සුරිඳෝ අසුන් අරන්නෝ

## 10 – අපව මවා සැමදා රකින

අපව මවා සැමදා රකින – අවැසිය කොයිකත් ගෙනදෙන
අදර සමිඳු දෙව් පියතම – බැතියෙන් නමදිමු අපි සැම
අපි ඔබ නමදිමු බැතියෙන – තුති දෙමු පසසා ඔබෙ ගුණ

සිංහල කොඩි ගොබ්වැල් මැද – සේසත් හා මුතු කුඩ ගෙන
රට දෙස බස ගුණ වැයුමට – යමු හෙලයිනි දෙව් පුදනට //

පිපුනු සමන් මල් අරගෙන – පැසුනු ගොයම් මිටි බැඳගෙන
තාලයකට පා තබමින – එක්වී යමු දෙව් පුදනට //

කඳු හා ගල් පර අතරින – පැන පැන රිංගා ගලමින
ඇද හැලෙනා දිය දහරා – හා එක්වී යමු පුදනට //

## 11 – පිනිබිඳු සැලෙනා

පිනිබිඳු සැලෙනා හිරු රැස් දිලෙනා
නව දිනකට අප පා තබනා
රස ගී ගැයෙනා දෙවිඳු පැසසෙනා
නව සිතුවිලි ගොමු කර හදිනා //

ඔබහට පැසසුම් වේවා – අපහට දුන් නව දිනටා
ඔබෙ නම ලෝ පැතිරේවා – අප මුවගින් නිසි ලෙසිනා

වැසි පොද වැටෙනා මඳ නල හමනා
අප සිත් සතුටින් ඉපිල වෙනා
ගී හඬ නගනා දෙවිඳු පැසසෙනා
නව සිතුවිලි ගොමු කර හදිනා //

ගස් වැල් සැලෙනා සුදු මල් වැලෙනා
මුළු පරිසරයම ඔප කරනා
පුදසුන සරසා සුවඳ මල් තබා
ගයමි ඔබට නව ගී මේදිනා //

## 12 – බිංදු බිංදු සිරි වැහි පොද

බිංදු බිංදු සිරි වැහි පොද – හිරු රැස් අතරින් හැලෙමින
දෙව් ආසිරි ගංගාවන් හා එක්වෙනවා
ගිරි කඳුවැටි මුව සිපගෙන – මල් සුවඳක් එක්කර ගෙන
දෙව් ආසිරි සුළං රොදක් ඇත හමනවෝ
ඇත හමනවෝ

අලුත් ලොවක් සොයා – නව දිවියක් කරා //
ඔබ තබනා පියවර යට – දහසක් මල් පිපේවා
දහසක් මල් පිපේවා

දුකක් නොම වෙවා – සැපක්ම වේවා //
බාධක සැම ජය ගන්නට – දෙව් ආසිරි ලැබේවා
දෙව් ආසිරි ලැබේවා

ජයෙන් ජය වෙවා – සුවෙන් සුව වෙවා //
මංගල ආසිරි ලබමින – ඔබ සැම නිති සැරදෙවා
ඔබ සැම නිති සැරදෙවා

## 13 – කොඩිවැල් තංවා

කොඩිවැල් තංවා – මල් දම් රන්දා – ඔබ මග සරසාලා
රන් දද බඳවා – රන් පට් ලෙලවා – මංගල සිරි මවලා

පැතුම් ගොඩක් පිරිලා – යැඳුම් ගොඩක් යැදලා //
සමිඳු පුදන්නට දෙවිඳු යදින්නට – පුදසුන වෙත ඇදිලා //

වීනා වයලා – රබන් ගසාලා – තුති බැති ගී ගයලා
නැටුම් නටාලා – ගැයුම් ගයාලා – මංගල සිරි මවලා

පහන් දල්වලා – හඳුන් සුවඳලා – පුදසුන ඔප කරලා
මලින් සරසලා – පාවඩ එලලා – මංගල සිරි මවලා

සතුට ඇවිල්ලා – දුක පහවීලා – සිනහාව මුව රැඳිලා
බේද දුරුරලා – එක්සත් වීලා – මංගල සිරි මවලා

දෙගුරුන් කැන්දා – සොයුරන් කැන්දා – එක පවුලක් වීලා
සැම දෙන කැන්දා – එකමුතු වීලා – මංගල සිරි මවලා

## 14 – රස ගීත ගයාලා

රස ගීත ගයාලා - නෙත දෙව්ඳු යොමාලා
නෙක මලින් පුදාලා - පසසමු සක් පිඹලා

රස ගීත නදින් - සෙත ලබන ලෙසින්
පසසාලම් දෙව් සමිඳා //

ආ! දෙව්ඳු බලතුමෝ - වෙයි අපගෙ රජතුමෝ
යනු දෙසට දෙව්තුමෝ - දස දෙසේ සියලුමෝ

ඔබ වනා පිනවමු - ඔබ නම පතුරවමු
සිඹ දෙපා නමදිමු - සොබ සමිඳු දකිනෙමු

සැම විට ඔබ යදිනා - ඔබ දරු ලොවෙ වසනා
සුබ සෙත් සිරි යදිනා - සැම දින පෙම් හදිනා

## 15 – පොඩි පොඩි කුරුල්ලනේ

පොඩි පොඩි කුරුල්ලනේ ගී කවි කියපන්
කිචි බිචි නාදෙන් මිහිරක් නංවාපන්
සල සල පියාපතින් රිද්මය දීපන්
තොප මැවූ දෙවිඳුන්හට ගී හඬවාපන් //

පොඩි පොඩි මාළුවනේ ගී කවි කියපන්
සල සල වරල් තොපේ රිද්මය දීපන්
රැල රැල එකතුවෙලා තාලෙට නටපන්
තොප මැවූ දෙවිඳුන්හට ගී හඬවාපන් //

සැලි සැලි තුරුලිය රස ගී පොඩි කියපන්
වැනි වැනි මද නල හා රිද්මය දීපන්
පොඩි පොඩි මල් පොරවා තාලෙට නටපන්
තොප මැවූ දෙවිඳුන්හට ගී හඬවාපන් //

මනු අපි සැම එක් වී ගී පොඩි ගයමු
එතුමන් මැවිල්ල දෙන රිද්මය ගනිමු
දෙවිඳුන් පසසා වනවා තුති පුදමු
අප මැවූ දෙවිඳුන් හට ගී හඬ නගමු //

## 16 – දෙව්දුනි එම් මම පුදසුනටා

දෙව්දුනි එම් මම පුදසුනටා
ඔබගේ සේවෙට කැපවෙන්ටා
පිළිගෙන මගෙ දිවි මිනිස් බවේ
දිරිදුන මැන දිවි ඇරඹුමටා

අන් ඇස් සඳරෙහි උසස් වුවත්
එලෙසේ ම’සිතේ නොම වේවා
මහතුම් උස්තැන ඔබ සමිඳේ
මම ඔබේ අබලවූ සේවකයා

සේවයෙ ඔබේ දිවි අද ඇරඹේ
ඇනුම් බැනුම් ගෙරවුම් සිකුරුයි
සමිඳේ ඔබ මේ වින්ද බැවින්
නැත කිසිදා පසුබට වන්නේ

මව් පිය සොහොයුරු සොහොයුරියෝ
අත හිත දුන් සොඳ ගුරු මිතුරෝ
ලබැඳිව ජීවය රැව කෙරුවෝ
ආසිරි දේවා දෙව් සමිඳේ

## 17 – උපදිනවා හොඳ දවසක්

උපදිනවා හොඳ දවසක් – හමුවෙනවා සොඳුරු හදක්
පැවසෙනවා සුහද බසක් – බිහිවෙනවා කිතු පැතුමක්

නෙතගින් තොලගින් කියුමෙන් කෙරුමෙන්
ලස්සන මැවුමට - ලස්සන දෙන්නට
අප හදවත් දෙනවා //

දෙවිඳු ගෙනා යහ තිළිනේ – ආදරයයි මිනිස් බවේ
මිනිස් බවේ සෙනෙහ ලබා – හොඳ දවසක් උපදිනවා

අවුල් බවින් එළියක් දී – රුවැති ලොවින් බිහිකරලා
දෙවිඳු රුවින් අපව සදා – හොඳ දවසක් උදා කලා

## 18 – කුරුළු රංචු

කුරුළු රංචු උදෙන් පිබිද ගීත ගයනවා
සුවඳ පියුම් මානෙල් මල් දැන් පිබිදෙනවා
සොබා දහම වතට වතදී සිනා පානවා
සැවොමැ එක්වැ මැව්ව දෙවිඳු මහිමේ කියනවා

එන්න සැමදෙනා එක්වා අදරිනා
මෙ පුදසුන වටා ආදරින් මෙ දා
ගයා දණනමා වඳමු දෙවි තුමා

අළුත ගෙතුනු අරුත් පිරුනු වදන් සොයාලා
පසස දෙමින් මිහිරි සරින් තාල ගොතාලා
සැවොම එකවැ දෙවිඳුන් හොඳ ගයමු තුටුවෙලා
දෙවිඳු පුතුට තුරුළු වෙමින් සැනසිලි ලබලා

නටමු ගයමු සොඳුරු ලොවක සාදයෙන් පිනා
වියොල වයා සතුට බෙදා දසට සැම දිනා
සමිඳු සමග එක්වැ සිටින දුබල ලෙව් දනා
මිතුරු දහම වඩවි මොලොව ගයා සතුටිනා

## 19 – ඔදින් වැඩී

ඔදින් වැඩී පොලොවේ – සියලුණේ
ගොසව් හිමි සදා
සොම්නස් බර සිතිනි පිළි සමිඳු මෙහෙකරව්
එන්නැ ඔවුන් දෑ හමුවට තොසින් ගය ගයා

තැඟී එන්නැ දෙව්සුරුනට තොපේ ගී ගයා
ඔවුන් වහන්සේ තොපගේ තොසින් වනත්වා

වෙති දෙව්දෝ දනිව් එහිමි පා – එහිමි පා ඔවුන් වහන්සේ
මෙ අප මවා සදාලුහ අයත'ප එතුමා
අපි වමු ජනයෝ එතුමන් රුළේ බැටළුවෝ

වදිව් එතුමා දොරටු වාසලේ – වාසලේ දිදී තුතිනමා
වදිව් එතුම මණ්ඩපේට පසස ගී ගයා
එතුමන් හට තුති ද පුදා වනව් නමෙ'තුමා

කොතෙක් ගුණ මැ වෙතිද සමිඳුණේ සමිඳුණේ සදා තොසිඳෙනා
කුළුණු සෙනේ බර වන්නෝ ඔවුන් වහන්සේ
කපෙන් කපට එතුමාණෝ හිතවත් වන්නෝ

## 20 – මංගල සිරියෙන්

මංගල සිරියෙන් ඔද වැටෙනා – අපගේ දෙව්මැඳුරේ
මංගල උළෙලට මුණි ගුණ වැණුමට අපි රැස්
වෙමු මෙලෙසේ

වසරක අප ලද ආසිරි සමරා තුතිපුද නංවාලා
සමිඳුන් සමගින් එක්වී විසුමට ආසිරි ලැබ දේවා

කිතු බැතියෙන් අප එක්වීලා හැකියා නංවාලා
දෙගුරුන් ඇඳුරන් එක්වී විසුමට ආසිරි ලැබ දේවා

## 21 – හිරු පායන විට

හිරු පායන විට හිරු සමගින් නමදින්නම්
සඳු පායන විට සඳු සමගින් නමදින්නම්
සිතේ අගුණ දුරු කරන් ඇවිත් නමදින්නම්
හිරුත් සඳුත් නැති වුනත් ලොවේ නමදින්නම්

දුක දැනෙනා කල දුක සමගින් නමදින්නම්
සැප විඳිනා කල සැප සමගින් නමදින්නම්
ගතේ දුබල කම් අරන් ඇවිත් නමදින්නම්
දුකයි සැපයි පිරි මිනිස් ලොවේ නමදින්නම්

ගී ගයනා විට ගී සමගින් නමදින්නම්
වෙන වයනා කල වෙණ සමගින් නමදින්නම්
සමිඳු විමානේ ලැගුම් අරන් නමදින්නම්
නැටුම් ගැයුම් ගෙන බැතින් පිරී නමදින්නම්

## 22 - ගයමු වයමු

ගයමු වයමු සමිඳු පසසලා – සවන පිනන තාල සදාලා
සමිඳු වඳිමු සැවොම එක්වෙලා – අරුත් සපිරි වදන් ගොතාලා

හිරුට එළිය දුන්නේ කවුරුදෝ? (කවුරුදෝ)
සඳුගෙ සිසිල ලැබුනෙ කොහෙන්දෝ? (කොහෙන්දෝ)
දහසක් තරු වැව්වෙ කවුරුදෝ? (කවුරුදෝ)
මිනිස් ලොවද තැනුව දෙවිඳුනේ

දේදුන්නෙ පාට ගෑවෙ කවුරුදෝ? (කවුරුදෝ)
මලට සුවඳ හැමුවේ කොහෙන්දෝ? (කොහෙන්දෝ)
කුරුළු ගීත ගෙතුවෙ කවුරුදෝ? (කවුරුදෝ)
සොබා දහම මැව්ව දෙවිඳුනේ

කඳුද හෙල් ද මැව්වෙ කවුරුදෝ? (කවුරුදෝ)
දි'යැලි ගඟ සොයන්නෙ කවුරුදෝ? (කවුරුදෝ)
පිපුන නෙළුම සෙව්වේ කවුරුදෝ? (කවුරුදෝ)
සැවොම එක්ව වඳින දෙවිඳුනේ

## 23 – පුදසුන වෙතට ඇදී

පුදසුන වෙතට ඇදී – යමු පිරිසිදුව සැදී
සමිඳුන් අබියසදී – අපි ගයමු පසස තුති ගී

සමගිවැ සොහොයුරු හා සිතේ කහට පිසැදා
දුකේ කඳුළු තුටු සතුටු සිනා සියල්ල එසැවේ සමිඳු කරා

කිතු අනුගාමිකවී ගත දිරියෙන් සවිවී
මිනිස් බවට සෙත පිණිස දිවි වැයකරනට පතමුව ආසී

## 24 – නිල් ගුවනේ

නිල් ගුවනේ පාවෙන සුදු වලාකුලේ
තුරු වදුලේ ගී ගයනා කුරුල්ලනේ
පුදසුන වෙත යන මේ මොහොතේ
අප හා ඔබ හැම එක්වන්න

පෙති විහිදා හිනැහෙන මල් කුමරියනේ
රංවූ ගැසී ඉගිලෙන රත් සමනලුනේ
මැඳුර තුළට යන – මේ මොහොතේ
අප හා ඔබ හැම එක්වන්න

ගලා හැලෙන දිය ඇලි රූ රැජිණියනේ
දෙවිඳු මැවූ පණ ඇති නැති සියල්ලනේ
දෙව් හමුවට යන මේ මොහොතේ
අප හා ඔබ හැම එක්වන්න

## 25 – අරුණළු නැගෙන වෙලාවේ

අරුණළු නැගෙන වෙලාවේ
පිනි පොද වැටෙන උදාතේ
පිබිදි සතුටක් මවෙත ඇදී එයි //

සමිඳුනි ඒ ඔබ මවෙත ළගාවන
මොහතද කියනු මැනේ //

මල් රොන් හැලෙන වෙලාවේ මඳ නල මුදුව හමා ඒ
නවමු සුවඳක් මවෙත ඇදී එයි

සමිඳුනි ඒ ඔබ ම වෙත ළගාවන
මොහොතද කියනු මැනේ //

ඩා බිඳු නැගෙන වෙලාවේ
විරිය කයට මුවා වේ //
නොමියෙන සවියක් ම තුළ නැගී එයි

සමිඳුනි ඒ ඔබ ම වෙත ළගාවන
මොහොතද කියනු මැනේ //

මළ හිරු බසින වෙලාවේ
රත් පැහැ අහසේ ඇදී ඒ //
දැඩි වූ වෙහෙසක් හදට ගලා එයි

සමිඳුනි ඒ ඔබ ම වෙත ළගාවන
මොහොතද කියනු මැනේ //

## 26 – සුනිල දියේ

සුනිල දියේ වගුරු විලේ කුමුදු පිපෙනවා
නිසල රැයේ සඳෙළියේ සුවඳ හමනවා

ලෝකේ සැමා දෙමැව් පිය සඳේ
සොබා දහමේ ඔබට තුති පිදේ

බටිති ගිරා කැදලි කරා කඩිසර වෙනවා
සිඟති මුවෝ මව් කුලේ සුවය විඳිනවා

රැයට සඳද හිරු උදයට එළිය බෙදනවා
ගතට වැදී මද නලේ සතුට තියෙනවා

කුරුළු නදේ මිහිර වැදේ දුක දුරු වෙනවා
තුරුළු වෙලා ඔබ වටා ඔබ පසසනවා

## 27 – අළුත් ඉරක් පායලා

අළුත් ඉරක් පායලා –අළුත් දිනක් උදා වෙලා
කුරුළු ගීත සිසිල් සුලං – රැළි අතරේ පාවෙලා
හරි ලස්සන මෙවන් දිනක් – සිත් සනසන මෙවන් දිනක්
ඔබයි අපට උදා කරන්නේ සමිඳුනේ

මේදින මගේ වැඩ සියල්ල
සතුට සිනා කඳුළු මෙන්න //
ඔබ හට බාරයි – සමිඳෙ
ඔබ හට බාරයි

රටට සෙතක් උදා වෙන්න
ඒ වෙනුවෙන් වෙහෙස වන්න //
උදව් දෙනු මැනේ – සමිඳෙ
උදව් දෙනු මැනේ

දවස ගෙවී වැඩ වරන්න
වෙහෙස මැදින් තුති පුදන්න //
රකිනු මැනවි මා – සමිඳෙ
රකිනු මැනවි මා

## 28 – දහසක් සිතුවිලි

දහසක් සිතුවිලි පසෙක තබා
දෙව්දුන් වෙත අප සිත් ඔසවා
එක සිතුවිල්ලක රැඳී සිටින්නට
දෙව්දු නමට ගී පසස ගයන්නට

එක්වෙව් කිතුනුවනේ //

"මගේ නමින් කොතැනක හෝ එක්වන
ජනතා අතරේ මම සිටිමි"
යනුවෙන් සමිඳුන් දෙසූ වදන්
මෙනෙහි කරමු මේ මොහොතේ

සගේ පියාණන් මහිමය සඳහා
අප හැකියාවන් යොමු කරමු
එතුමන් වරමින් පිරිපුන් වී
පුද දැහැනේ සම වැදෙමු

## 29 – හිරු නැග එන විට

ආලේලූයා ///
හිරු නැග එන විට අඳුර මැකෙන්නේ
අඳුර මැකී කිඳු රැස් විහිදෙන්නේ
දිදුලන රැස් ලොව එලිය කරන්නේ
මේ හැම සමිඳුගෙ මහිමෙ කියන්නේ

හිරු පායන විට පිණිකැට වියැලේ
පිණිකැට වියැලේ අතුරුදහන් වේ
හිරුකැන් ඔප වී ගහ කොළ සරුවේ
මේ හැම සමිඳුගෙ මහිමෙ කියන්නේ

හිරු නැග එන විට ගස්වැල් පිබිදේ
ඒ හැම පිබිදී අතු පල බර වේ
අතුපල බර වී බිමට පහත් වේ
මේ හැම සමිඳුගෙ මහිමෙ කියන්නේ

## 30 එක සිතින්

එක සිතින් එක මුවින් – කිතු තුමන් පසසමු
ප්‍රේමයෙන් ඉවසුමෙන් - දුබලයන් නගවමු

හිම්නැති ප්‍රේමට හිම්කම් කීවේ
කිතුතුම මිස වෙන කවුරුදෝ
සැලුණු හදවත් නිසල කෙරුමට
කිතුතුම හට බැරි වේදෝ

විසිර ගියවුන් එකතු කෙරුවේ
කිතුතුම මිස වෙන කවුරුදෝ
බිඳුණු පවුලක් නගා සිටුමට
කිතුතුම හට බැරි වේදෝ

දුගි යැදුමට සවන් දුන්නේ
කිතුතුම මිස වෙන කවුරුදෝ
පීඩිත ජනහට සහනය දෙන්නට
කිතුතුම හට බැරි වේදෝ

## 31 – දෙවිඳුන් ගුණ කරුණා

දෙවිඳුන් ගුණ – කරුණා
පසසමු නිති – පෙම්නා
මිහිවැසි සැවොම – දනා
එක්වමු සිත – ඔදිනා

අප දෙව්පිය හට සහ එක – පුතුහට
ගුණ ගයමින් අපි නිති – වනමු
සිරිඳු සුදත හිමි පෙමින් – වසාලමු
ගැයුම් වැයුම් සමගම – පුදමු

ලතවුනු මුදු – පවිනී
ගැලවුම අපට – දුනී
කරුණාබර – පියෙනී
නමදිමු ඔබ – තුටිනී

දුරු කර සැම – නපුරේ
කැලලන් අප – සම්දේ
දිවිදුන් බව – සම්දේ
සිහිකරනෙමු – නිතිනේ

හදකින් හදට – වෙලී
සොහොයුරු පෙමින් – ඇලී
පුදසුන වෙතට – ඇදී
ගයනෙමු ඔබට – තුතී

## 32 – දෙව් සමිඳුන් හට පින්දෙව

දෙව් සමිඳුන් හට පින්දෙව අපව මැව්වෙ දෙව් තුමා
ඉර සඳ හා තාරකාද මැව්වෙත් එතුමා
දෙව් සමිඳුන් හට පින්දෙව එළිය මැව්වෙ දෙව්තුමා
රෑයද දවාලද අප හට දෙන්නෙත් එතුමා

එන්න යන්න අපිත් එක්ක දෙවිඳු වඳිනටා //

දෙව් සමිඳුන් හට පින්දෙව පොළව මැව්වෙ දෙව්තුමා
කඳුහෙල් හා තුරුවැල් සැම මැව්වෙත් එතුමා
දෙව් සමිඳුන් හට පින්දෙව පොළව මැව්වෙ දෙව්තුමා
සියොතුන් සහ වන සතුන්ද වැව්වෙත් එතුමා

දෙව් සමිඳුන් හට පින්දෙව ජලය මැව්වෙ දෙව් තුමා
ඇළදොල ගංගා සයුරද මැව්වෙත් එතුමා
දෙව් සමිඳුන් හට පින්දෙව ජලය මැව්වෙ දෙව්තුමා
ජලයේ හැසිරෙන මසුන්ද මැව්වෙත් එතුමා

## 33 – විමන් දොරටු

විමන් දොරටු දොරගුළු හැර ඇත අතීතයේ
පහන් සිතින් හැරී බලන් සිතුම් සමීරයේ

සතුට සුව සදා සම්දෙ ඔබ එදා
කළ දහසක් දේ සමරමු – බැති කුසුම් පුදා

ඔබේ දිවි පුදා – ලොවට සෙත සදා
සම්දුනි ඔබෙ ගුණ සමරමු – බැති කුසුම් පුදා

වහල් බැම් මුදා – විමුත් මග සදා
සත වෙත පෑ මෙත සමරමු – බැති කුසුම් පුදා

## 34 – ලොව මුදනා ලෙස

ලොව මුදනා ලෙස දිව්පිදු කුමරුගේ කුරුසිය පාමුල
වැඩලුන් දෙව් මව්නේ
එම දිව් යාගය දැන් ඔබ සමගින පුදනට අපහට
ලැබ දෙනු දෙව් සරණේ

මම දෙවියන්වහන්සේගේ පූජාසනය වෙතට යන්නෙමි
මා ප්‍රීතිමත් කරන දෙවියන්වහන්සේ වෙතට යන්නෙමි

දෙවියනි / ඔබගේ විනිශ්චයේදී මා නිදහස් කළ මැනව
අධර්මිෂ්ඨයන්ගෙන් මා වෙන්කර / මා මුදා ගත මැනව

දෙවියනි / ඔබවහන්සේ මාගෙ ශක්තිය වනසේක
එහෙයින් සතුරාගෙන් මා රැකගත මැනව

දෙවියනි / ඔබවහන්සේගේ ගෘයයට ඇතුළුවන්ට හැකිවන
පිණිස
ඔබවහන්සේගේ සත්‍යයේ ආලොකය මට දුන මැනව

## 35 – පෙමැති රජිඳුන්

පෙමැති රජිඳුන් යදිමු දෙවිඳුන්
පූදසුන වෙත් අපි පා නගලා
එකතු වීලා සොයුරු පෙමිනා
යදිමුව අප දෙවිඳුන් සැවොමා //

ඔබහට පැසසුම් වේවා – අප මංගල දිනයේ
පූදසුන වෙත අපි පා නගලා – නමදිමු ඔබව සදා

පිවිතුරු සිතකින් පිවිතුරු හදකින්
එකමුව එක දෙවිඳුන් පසසා
පවිටු සිතිවිලි දමිටු ඇදහිලි
සමගින් දෙවිඳුන් සිත නොරිදා //

## 36 – සමිඳුන් පුදන්න

සමිඳුන් පුදන්න තුති ගී ගයන්න
නගන්න පියමං මැදුර කරා //

සමිඳෝ අප ආලෝකේ – එතුමෝ අප ආධාරේ
වීණා වයලා – ගී හඬ නගලා
පසසමු එතුමගෙ තෙද මහිමේ

සුදු පිලි ඇඳ සැරසීලා – රන් රිදියෙන් ඔප වීලා
සමගි වඩවලා – භේද දුරුලලා
පසසමු එතුමගෙ තෙද මහිමේ

කුල මල නැහැ සලගන්නේ – සැවොම දරුවො එතුමන්ගේ
සාමය බෙදලා – දරුකම වඩලා
පසසමු එතුමගෙ තෙද මහිමේ

දුප්පත් පොහොසත් වාදේ – ඉදිරියේ නැහැ එතුමන්ගේ
සැවොම එකා මෙන් – එකමුතු වී අපි
පසසමු එතුමගෙ තෙද මහිමේ

සුවඳ දුමින් ඔසවන්නේ – පැසසුම් වේ අප සැමගේ
මිහිරි හඬ නගා – සුපිරි හද පුරා
පසසමු එතුමගෙ තෙද මහිමේ

## 37 – අදහම් මගෙ සමිඳුනේ

අදහම් මගෙ සමිඳුනේ – වචනේ ඔබගේ //

"මම උත්ථානේ මමයි ජීවිතේ
කව්ද මා කෙරේ අදහා ඉන්නේ
නිවී ගියත් ලොවට මේ
ජීවත් වන්නේ"

"මගෙන් ජීවිතේ ලබා සිටින්නෙ
තවද මා පෙමේ පතා සිටින්නේ
ඒ කවුරුත් කිසි මැ දා
මැරී නොයන්නේ

## 38 – ඔබයි අපට

ඔබයි අපට දිරියත් කෙම් බිමත් දෙවියනේ
ළඟින් ඉන්න උදව් කරුවො විපත් වතාවේ
දෙරණ සැසැලුනත් නෑ අප බියපත් වන්නේ //

හමුදාවන්ගේ සමිඳෝ අප හා වන්නෝ
ජකොබුන්ගෙ දෙවිඳාණෝ බල කොටුව අපේ

කඳුද පවා වැටී ගියත් මුහුදේ පත්ලේ
ගොරවා පෙන දා නැගුනත් දියකඳ මුහුදේ
කඳුන් සසලවා නැගුනත් රළගෙඩි සයුරේ //

එව් විමසව් සමිඳාණන් සිදුකළ දේවල්
පොළොව පිටේ එතුමන් කළ බිහිසුණු විකුමන්
යුද කෙළි එතුමෝ පොළොවෙන් මකා දමන්නො //

## 39 – මා රැකවරණය

මා රැකවරණය සමිඳාණන්මය
එතුමන් ඇති තැන මට හිඟ නොමැතේ

සමිඳාණෝ මාගේ එඬේරාණෝය
මට කිසි දෙයකින් හිඟයක් නොමැත්තේය
තිල්තණ බිම් මත මා සතපවන සේක
නිසල දිය අසල මා ගෙන යන සේක

මා අඳුරු මිටියාවතේ සැරිසරතත්
කිසි දෙයකට මම බිය නොවෙමි
මක්නිසාදයත් ඔබ මා වෙතය

මාගේ ජීවිතයේ සැම දිනකම
යහපත් කමත් කරුණාවත් මා පසු පස එන්නේය
සදාකාලයටම මම සමිඳාණන්ගේ නිවසෙහි
ජීවත් වන්නෙමි

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට
දැනුත් සදාකල්හිත් මහිමය වේවා

## 40 – මා රැකවරණය සමිඳා වේ

මා රැකවරණය සමිඳා වේ
මට හිඟයක් නොමැතේ
තිල් තණ බිම් මත රඳවන්නේ
සමිඳු එඬේරාවේ

පැහැදිලි දිය වෙත ගෙනයන්නේ මා සිත පුබුදන්නේ
සමිඳුන් නාමය අගයනසේ නිසි මග ගෙනයන්නේ

යන්නට වුවමුත් අඳුරු මගේ නපුරට බිය නැත්තේ
සැරයටියකි ඔබ අත අත්තේ මට එය සැණසුම වේ

## 41 – මගෙ රකවරණේ

මගේ රකවරණේ බල කොටුව මගේ
ඔබයි දෙවියනේ සදහට ඔබයි දෙවියනේ
මගෙ පිළිසරණේ ඔබයි සමිඳුනේ
නොවේ නොවේ කිසිදු බියක් ඔබේ ළැගුම් පළේ

මහ උතුමන් රකවරණේ යටැ ගැවැසෙන්නේ
සබලවතාණන් ඇසුරේ හෙවණ ලබන්නේ
සමිඳාණන් අමතා ඔහු මෙසේ කියන්නේ
"ඔබ මැ කෙරේ පතා සිටිමින මගේ දෙවියනේ"

උගුල් අටව ඔබ නසනට බැලුවත් සතුරා
ඔබ නිදහස් කැරැ ගන්නේ ඔබේ හිමි සඳා
එතුමෝ තම පියාපතින් ඔබ වහගන්නෝ
එතුමන් අත්තටු යටැ ඔබ සඟවා ගන්නෝ

## 42 – දියත සොයා දුවයම්

දියත සොයා දුවයම්
පවස ඔබයි දෙවිඳුනේ
කවද දකිම් සතුට නැගේ
ගලයි කඳුලු නිමක් නොවේ

ගලන දියට සුසුම් ලමින් පවසේ දුවන්නේ
මුවකු ලෙසයි පිපාසයේ සුරිඳු පතන්නේ

පතා හිඳිනු සමිඳු සදා නිතින් තුති නගා
සසල නොවනු දුකින් තොරව මහිම සරණෙනා

## 43 - මගෙ හද සම්දුන්

මගෙ හද සම්දුන් වෙතට ඇදේ
එතුමන් තුල ජීවනය ඇතේ
සැනසුම නිති සැප දෙවිඳු වෙතේ
කවදා එතුමන් දැක ගන්නේ

ගලන දියට ආශාවෙන් පෙළෙන මුවකු ලෙසින්
දෙවියනී මාගේ ආත්මය ඔබවෙත ඇදී එන්නේය

ජීවමාන දෙවියන් කෙරෙහි
මාගේ ආත්මය පිපාසයෙන් පෙළෙන්නේය

මට කවදා දෙවිඳුන්ගේ මුහුණ
දැකගන්නට ලැබෙන්නේද

දෙවිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න
මම තවම ගැලවුම්කාර දෙවිඳුන්ට ප්‍රශංසා කරමි

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට
දැනුත් සදහටත් මහිමය වේවා

## 44 – සමිඳුන් වෙත මගෙ

සමිඳුන් වෙත මගෙ හද යන්නේ
එතුමන් සොයමින් වෙසෙසෙන්නේ
අන් දෙයකින් තිති සැප නැත්තේ
සමිඳුන් ඇති තැන සැනසුම වේ

අහෝ දෙවිඳුනී ඔබ මාගේ දෙවිඳාණෝය මම ඔබ සොයමි
මාගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසයෙන් පසුවේ

ඔබගේ ප්‍රේමය ජීවිතයට වඩා අගනා නිසා
මාගේ තොල් ඔබට ප්‍රශංසා කරනනේය

ඒ නිසා මාගේ ජීවිතය මුළුල්ලේ
ඔබ තේජස ප්‍රකාශ කරමි
ඔබ නම අයදිමින් මගේ අත් ඔසවමි

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට
දැනුත් සදහටත් තුති ප්‍රශංසා වේවා

## 45 – අපෙ ගත සිත

අපෙ ගත සිත සමිඳුට කැප කරමු
අපෙ පඬුරුද තිළිණද පුද කරමු

මහත් දුකින් පෙළෙමි, කී සඳ පවා
සමිඳුන් වෙත විශ්වාසය තැබුවෙමි

සමිඳාණන් මා වෙත දැකවූ කරුණා ගුණ නිසා
මා එතුමන්ට කෙසේ තුති දෙමිද

ගැලවීමේ කුසලාන ඔසවමින්
සමිඳුන්ගේ නාමයට හඬ ගසමි

මම ඔබට තුති පඬුරු පුදමි
ඔබගේ නාමයට නිති හඬ ගසමි

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට
දැනුත් සදහටත් තුති ප්‍රශංසා වේවා

## 46 – දයා ගුණ කඳේ

දයා ගුණ කඳේ සමිඳාණන්ගේ
සතත කල්හි ඒ පවතින්නේ
ආලේලූයියා ආලේලූයියා

සමිඳුන් ගුණ කඳක් නිසා සිටිව් තුති පුදා
දෙව්වරුන්ගේ දෙවිඳුන් හට සිටිව් තුති පුදා
හිමිවරුන්ගේ සමිඳෝ වෙති සිටිව් තුති පුදා
එතුමන් ඇරැ විස්කම් පෑ කෙනෙක් නැත කෙදා

අහස් කුසේ එතුමන් නැන මහිමෙන් සෑදුවෝ
මූහුදු පතුලෙ පොළව තරයෙ පිහිටුව ලූවෝ
මහා එළිය මණ්ඩලයන් එතුමෝ මැව්වෝ
හිරුට දවල හඳ තරු හට රෑ පැවැරුවෝ

අප සතුරන් අතින් අපව උදුරා ගත්තෝ
පණ ඇති හැම සතුන් හටම අහර සැපෙව්වෝ
සග වැසි අප දෙව් සුරුනට නමවී තුති පුදා
එතුමාණන් දයාව නිති කල්හි පවතිනා

## 47 – යහමග යන සැම

යහමග යන සැම දැහැමි දනා
සමිඳුට නිති දින ප්‍රිය වන්නේ
දෙවිඳුන් අණ සැම පිළි ගන්නේ
අදමිටු මග නිති හැරයන්නේ

අදමිටුවන් අනුව නොයන තැනැත්තා
ප්‍රීතියෙන් පසු වන්නේය
පව්වු දනන් අනුව නොයන්නා
ප්‍රීතියෙන් පසු වන්නේය

සමිඳුන්ගේ අණ පනත් කෙරෙහි ප්‍රීතිවන
තැනැත්තා ආශීර්වාද ලද්දේය
ඔහු කරන සැම දෙයක්ම සඵල වන්නේය

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට තුති වේවා
දැනුත් සදහටත් ප්‍රශංසා වේවා

## 48 – දෙවිඳුනී අප වෙතේ

දෙවිඳුනී අප වෙතේ ඔබගේ අදර කරුණා පා
දුබල පව්වූ සතට වෙනු මැනේ කමා

දෙවියනී ඔබගේ ඉමහත් කරුණාව නිසා
මට දයා වුව මැනව
ඔබගේ අනුකම්පාව නිසා මා නිදොස් කල මැනව

මාගේ දොස් වලින් මා මුළුමනින් සෝදලනු මැනව
මාගේ පාපයෙන් මා පිරිසිදු කල මැනව

මම මාගේ පව් දනිමි සැම විට මාගේ
පාපය මා ඉදිරියේ ඇත්තේය

ඔබට විරුද්ධව ඔබට පමණක් විරුද්ධ
මම පව් කලෙමි ඔබ ඉදිරියේ අයහපත් දේ
මම කෙලෙමි

දෙවියනී නිර්මල හෘදයක් මා තුළ මැවුව මැනව
නොසැලෙන ආත්මයක් මට දුන මැනව

ඔබගේ සහනයේ ප්‍රීතිය මා වෙත දානය කල මැනව
බැතිමත් ආත්මයකින් මා
ප්‍රාණවත් කල මැනව

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට තුති වේවා
ආදියේ වූවාක් මෙන් දැනුත්
සදහටත් වේවා

## 49 – සමිඳුනි ඔබෙ පෙම්

සමිඳුනි ඔබෙ පෙම් කරුණා පා – ඔබෙ නෙත් අප වෙත යොමු කරලා
අසරණ අපහට සරණ වෙලා – සැම තපුරෙන් ගැලවීම දෙවා

ස්වාමිනී මාගේ හද පත්ලෙන් ඔබට මොර ගසමි
ස්වාමිනී ඔබ අපගේ අයහපත් කම් ගණන් ගන්නා
සේක් නම් කා හට ජීවත් විය හැකිද

මම ස්වාමින් වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුවෙන් සිටිමි උන්වහන්සේගේ
වචනය මම විශ්වාස කරමී

මක්නිසාදයත් ස්වාමින් වහන්සේ කෙරෙහි
අනුකම්පාව ඇත්තේය උන්වහන්සේ තුළ
ගැලවීමේ සම්පූර්ණත්වය ඇත්තේය

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට
දැනුත් නිරතුරු ප්‍රශංසා වේවා

## 50 – දෙවිඳු වඳින

දෙවිඳු වඳින දැහැමි දනට සැපත ලැබෙන්නේ
සැම දන හට සෙත සලසා ආසිරි ලබන්නේ

සමිඳුන්ට ගරු කරන තැනැත්තා ප්‍රීතියෙන් පසුවන්නේය
සමිඳුන්ගේ පණත් ඔහු සතුටින් පිළි ගන්නේය

ඔහුගේ පුත්‍රයෝ ලෝකයේ බලවත් වන්නෝය
හරි මග යන්නන්ගේ දරුවෝ ආශීර්වාද ලද්දෝය

වස්තු සම්පත් ඔහුගේ නිවසෙහි වන්නේය
ඔහුගේ දැහැමි බව සදහට පවතින්නේය

යහපත් අයහට ඔහු අඳුරේ දිස්වන ආලෝකයක් වන්නේය
ඔහු ත්‍යාගවන්තය දයාවන්තය යහපත්ය

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට
දැනුත් සදහටත් තුති ප්‍රශංසා වේවා

## 51 – එළිය ඔබ මගේ

එළිය ඔබ මගේ මගෙ පිළිසරණේ
කාට බියේ සිටිම් ද මම් සමිඳුණේ
මගේ ජීවිතේ බලකොටුව ඔබේ
එබී හිඳිම් කා ඉදිරියේ හම් සඳේ

මට හතුරුවැ කඳවුරු බැඳ සිටියත් හමුදා
නැ සැලෙන්නේ හදවත මගෙ බියෙන් මිරිකිලා
යුද සේනා නැඟෑ සිටිතත් මා තැති ගත්වා
ඇදැහිලි සිත මගෙ කොහෙත්මැ නොයයි පිරිහිලා

අයැදිම් මම් එක වරයක් ඔබෙන් සමිඳුණේ
එය මැ පතා සුසුම් හෙලම් හිම්පා සඳුණේ
අවසර මට දෙන්නැ මගේ ජීවිත කාලේ
සියලු දවස් ගෙවා ඉන්න ඔබේ නිවහනේ

සොයනෙම් මම් මුහුණ ඔබේ අනේ සමිඳුණේ
ඔබේ මුහුණ මගෙන් අනේ සඟව නොගන්නේ
උදහස පා ඔබේ ගැත්ත පිටු නොදකින්නේ
කවදාටත් ඔබයි මගේ පිළිසරණ වුණේ

අත්හැරු මා දමනු එපා පිළිකෙව් කැරුලා
අනේන දෙවියනේ ඔබ මගෙ ගැලැවුම් කරුවා
පියා මගේ අම්මා හෝ එපා කළත් මා
සමිඳුනි ඔබ නැ ඉන්නේ බාර නොගෙනැ මා

සමිඳුන් ගුණ කඳ දයාව දකිම් සහතිකේ
දිවමන් ජනතා ඉන්නා රටේ ඔබැ සූරේ
පතා සිටිම් එකක් හිතින් දිරි වඩා හිතේ
නොවක් සිතින් අදහ සිටිව් හිමි සඳුන් කෙරේ

## 52 – සමිඳේ ඔබ ඔබේ දෙසට

සමිඳේ ඔබ ඔබේ දෙසට සෙත සැලසූවෝ
වහල් කමින් ජාකෝබුවත් ගලවා ගත්තෝ
ඔබෙ ජනතා කරපු වැරදි අමතක කෙරුවෝ
ඔවුන්ගේ පව් කම් හැම ඔබ වළු ලා දැම්මෝ

අනේ අපට පෙන්වනු ඔබෙ දයාව සමිඳේ
අපට ඔබේ ගැලවීමත් සලසා දෙන්නේ

තවද ඔබේ හිතවතුනට නොවන් සිතින් හා
එතුමන් වෙතැ හැරෙන්නනට සාමෙ ලැබෙන්නා
ඔබට බියැති අපට ඔබේ ගැලවුම ළං වේ
මෙ අප දෙසේ දෙව් මහිමේ ඇවිත් නතර වේ

දයාව හා හිතවත්කම එකතුව් සිටී
දැහැමියාව සමාදානෙ සිප වැළැඳ ගනී
හිතවත්කම පොළොවෙන් එයි මතුවෙලා නැගී
දැහැමියාව සුරලෝ සිටැ බලයි ගෙනැ නැමී

සමිඳෙ අපට සෙත් ආසිරි වස්වා දෙන්නේ
නගා දෙන්නැ අපේ බිමේ අස්වනු වැඩියේ
දැහැමියාව ගමන් කරයි එතුමනි දිරියේ
එතුමන් පියවර පස්සේ ගැලැවුම එන්නේ

## 53 – කරුණාබර අප පිය දෙවිඳේ

කරුණාබර අප පිය දෙවිඳේ
මෙම දිවියෙන් පසු ඔබ දැක ගැන්මට
වර දෙනු මැන අප සුර සමිඳේ

සමිඳුනි ඔබගේ වචනය ලෙසින්
ඔබ දාසයා දැන් සාමයෙන් හැරලනු මැනව

මක්නිසාද ඔබ සියල් ජනයන් ඉදිරියේ
සූදානම් කරන ලද ගැලවීම මම දැක ගතිමි

ඊශ්‍රායෙල් ජනතාවගේ මහිමය
ජාතින්ගේ පැහැදීම පිණිස ආලෝකයද එයම වන්නේය

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට තුති වේවා
දැනුත් සදහටත් මහිමය වේවා

## 54 – අඳුර මගෙ සිතේ

අඳුර මගෙ සිතේ පහන ඔබ වෙතේ
හිරුද තරුද අඳුරු වුවද ඔබව මට ඇතේ
හිරුද තරුද අඳුරු වුවද ඔබව මට ඇතේ
ඔබව මට ඇතේ ජේසු ඔබව මට ඇතේ

පරව මල් වැටේ බිමට මල් වැටේ
මමද පරව වැටෙමි බරව ඔබගෙ තුරුලටේ
මමද පරව වැටෙමි බරව ඔබගෙ තුරුලටේ
ඔබගෙ තුරුලටේ ජේසු ඔබගෙ තුරුලටේ

## **55** – අලුත්ම ගීයෙන්

අල්ලෙලූයා අල්ලෙලූයා
අල්ලෙලූයා

අලුත්ම ගීයෙන් සමිඳුන් ගයමු
අපි සැම සතුටින් එතුමන් වනමු
මනු සැම අදරින් මැව් දෙවිඳුන් හට
ගයනෙමු තුති ගීතා

තුති වේවා සැරදේවා මංගල වේවා
ඔබ හට අද දින තුති මංගල ගී
ගයන්නේ ඔබ දරුවෝ //

හෙළ බිම ලස්සන ඔප ගන්වාලා
හෙළ බිම අපහට මව් බිම කරලා
හෙළ බිම සිරිගන්වන දෙව් සමිඳුට
ගයනෙමු තුති ගීතා

කරදර කලහල මැද සොහොවුරු සේ
ආදර පෙම් කළ කිතු සමිඳුන් සේ
සමූහ ජීවය ගෙනදුන් සුරිඳුට
ගයනෙමු තුති ගීතා

## 56 – තේජස මහිමය

තේජස මහිමය පිරි රජිඳාණෝ – කවුදෝ මේ රජිඳාණෝ
සැම බල සැම ජය සතු හිමිපාණෝ – ලොව පාලක සමිඳාණෝ

මුළු ලොව දෙවිඳුන් සතුවේ – සැම දෙය දෙවිඳුට හිමි වේ
සමුදුර නෙරපා ගොඩ බිම සැදුවේ – මෙම මහබල දෙවිඳුන්වේ

දෙවිඳුන් දුටුවේ කවුදෝ – සුර වත දැක්කේ කවුදෝ
ඇත්තට දිවිදුන් පිරිසුදු අතසිත - සතු අය පමණක් නොවෙදෝ

දෙවිඳුන් ආසිරි ඇසුවෝ – සමිඳුගේ යහපත ලැබුවෝ
ගැලවුම් කරුවූ සමිඳුන් ඉදිරියෙ - වැඳ වැටෙමින් පුද දෙන්නෝ

ඉපැරණි දොරටුව හරිමින් – කැඳවනු සුර රජිඳාණන්
සැම සෙත විදහා පැමිණේ සුරලොව – සැම බල නායක සමිඳුන්

## 57 – එන්න යන්න මා හා

එන්න යන්න මා හා
පියාගේ නිවහනටා ///
එන්න යන්න මා හා
පියාගේ නිවහනටා
එහි සොම්නස වේ සොම්නස වේ
සොම්නස වේ

වැඩිම දුරක් නැත්තේ පියාගෙ නිවහනටා
පියාගෙ නිවහනටා

ජේසු ක්‍රිස්තු මග වේ පියාගෙ නිවහනටා
පියාගෙ නිවහනටා

ජේසු ක්‍රිස්තු එළියයි පියාගෙ නිවහනෙහී
පියාගෙ නිවහනෙහී

සාමය ප්‍රේමය වේ පියාගෙ නිවහනෙහී
පියාගෙ නිවහනෙහී

පසසමි අප සමිඳුන් පියාගෙ නිවහනෙහී
පියාගෙ නිවහනෙහී

## 58 – හෙම්බල ජෙරුසලමේ

හෙම්බල ජෙරුසලමේ
ගය ගයා පසස හිම්පා
හෙම්බල සියොනේ සමිඳුන් ඔබගේ
පසසව උදන් අනා

වාසල් දොරටු ඔබේ එතුමෝ තර කෙරුවෝ
දරු කැල ඔබෙ හෙවණේ සෙත් ආසිරි ලැබුවෝ
සීමා ඇතුළෙ ඔබේ සාමය ඇති කෙරුවෝ
සරුවට තිරිඟු වවා ඔබ පුරවා ලූවෝ

හැම තැනැ දෙරණ පිටේ අණ පණිවුඩ යවනෝ
වචනේ එතුමන්ගේ දිවැයයි ළහි ළහියේ
බැටළු ලෝම වාගේ හිම්පා වස්වන්නෝ
අළු වැස්සක් වාගේ පිණි කැට විසුරන්නෝ

## 59 – වෙති වෙති හිම්පාණෝ

වෙති වෙති හම්පාණෝ රජිඳෝ
නැති ගෙනැ වෙව්ලති ජනතාවෝ
කෙරුබ බලතා තවූ පිටැ එතුමෝ
අසුන් අරා සිටිනෝ
පොළොවද කම්පාවේ //

සියොනේ කඳු මතැ සමිඳරුවාණෝ
තෙද බල මහිමෙන් වැජඹෙන්නෝ
සියුලුමැ ජන රැස් මත්තේ එතුමෝ
වෙති වෙති එක අදි පතියොණෝ

උන’තින් එතුමන් නම පැසසේවා
ඒ නම බියකරුවේ උතුමේ
හේලි හේලි වෙති ඒ උතුමාණෝ
මහ බල සම්පන්නේ එතුමෝ

සමිඳාණෝ අප දෙව් ඉසුරාණෝ
අයැදුම් අපගේ සපල කළෝ
දෙවියෝ ඔබ උන් කමා කරන්නෝ
වරදට උන් දඬුවම් කරණෝ

## 60 – සුර සෙන් බල පිරිසේ

සුර සෙන් බල පිරිසේ සමිඳේ
කොපමණ අගේද නිවෙස ඔබේ
මගෙ අත් බව ඔබ සොයා හැපේ
ඔබගේ මණ්ඩපෙ නිසා තැවේ

ඔබ වෙති මගෙ රජිඳෝ
වෙති ඔබ මගෙ දෙවිඳෝ

මගෙ රජිඳේ මගෙ දෙවි සුරණේ
ඔබගෙ නියහනෙ ඉන්න දනෝ
වෙති පින්වත්හු ඌ තුමූහූ
සදහට ඔබ පසසා ඉන්නෝ

ඔබගේ මණ්ඩපෙ ඇසුර ලබා
ඉන්නා මට එක දිනක් හොඳා
වෙන තැන දින දහසකට වඩා
වෙසෙස ගනිමි ඔබෙ නියස මෙදා

## 61 – මහ කරුණා

මහ කරුණා මෙතින් ඔබේ අනේ දෙවියනේ වත්නැ මට දයා
අනුකම්පා බරින් ඔබේ මකා දමන්නේ මගේ දොස් පමා
දොවනු අනේ තව තව මගේ / කෙලෙස් මලින් මා //
පිවිතුරුවට පිසැ දමන්නැ / පව් කම්නුත් මා //

මා කළ නොපණත් කම් මම දනිම් හොඳට ඒ මගෙ බර පාපේ
මගේ සිතින් නොමැකීමැයි ඒ පවතින්නේ තිස්සෙ දෙවේලේ
ඔබටමැ හතුරුවැ පමණෙකි / මා පව් කෙරුවේ //
ඔබේ ඇසට පිළිකුල් දේ / මා සිදු කෙරුවේ //

ගැලවුම් කරු දෙව්සුරුණේ මගෙ බර පාපෙන් මා ගලවන්නේ
තවද මගේ දිව ඔබගේ ගුණ කඳ සඳහා නොස පතුරන්නේ
හිම් සඳුනේ අනේ ළහනු / මුව විට මාගේ //
දිවද මගේ එවිටැ ඔබේ / පසස දෙසන්නේ //

ඔබට පුදන කිළිටි පුදන් කෙරේ නැත ඔබේ සතුට වඩන්නේ
ගින්නෙ දවන පුදවත් ඔබ පිළිකුලින් නොසා අහක දමන්නේ
පුළුවූ පඩුර ඔබට පුදන / බිඳුණු සිත මගේ //
බැගෑ බිඳුණු හද ඔබ නැත / එපා කරන්නේ //

## 62 – හරවා කන් ඔබගේ

හරවා කන් ඔබගේ පිළිතුරු දෙනු සමිඳේ
ගැත්තා අසරණයා හිඟකම් අඳුනන්නා
පණ මගේ රැකැ ගන්නේ ඔබෙ හිතවතා අනේ
ගැත්තා ගලවන්නේ හේ ඔබ අදහන්නේ

පෙන්නා දෙනු මට සමිඳුණෝ
යන්නට ඔබෙ හරි මග දිග'නේ //

මගෙ දෙවිඳුරු ඔබනේ – මට කරුණා වන්නේ
දිගටමැ දවස පුරා – සිටිනෙමි ඔබට'ඬගා
ඔබෙ ගැතුනට සමිඳේ – තොස වඩවා දෙන්නේ
ඔසොවමි ඔබට මගේ – අත් බව සමිඳානේ

ඔබෙ හද උණුවන්නේ – කරුණාවෙන් පිරුණේ
උදහස ඔබ සමිඳේ – නැ නැ දක්වන්නේ
දයාව උතුරන්නේ – ඇත්තේ ඉසුරානේ
මා වෙත හැරි බලා – මට දක්වනු කරුණ

ඔබෙ දැස්සගේ පුතා – දිරි ගන්වා ගලවා
ඔබගේ පිය ඇලුමේ – ලකුණක් මා සඳහා
මගෙ සතුරන් හට පා – උන් විළියෙන් පුරවා
ඔබ මා සනසන්නේ – වනු මට පිළිසරණේ

## 63 – සැලෙන හදින්

සැලෙන හදින් මා තනියම වැලි කතරක් මැද
පා නගන්න බැහැ තනියම ඝන අඳුරක් මැද
රෑ අඳුරේ මා තනි වී පාළු බිමක් මැද
මේ අඳුරේ ඔබ එනවද මගෙ දෙව් සමිඳේ

කතර සරා වෙහෙස වෙලා සොය සොයා යමී
අඳුර සිඳින පහන් එළිය සොයා මම යමී
පහන් දවන හිමි සෙවනේ දිවි ගෙවනෙමී
ගමන පාළු නැහැ සමිඳුනි ඔබ කැටුව එමී

මාර්ගයද ඇත්ත ද ජීවනය මම වෙමී
ඔබ තෙපලූ වදන් අසා ඔබ සොයා එමී
ජීවිතයට ආලෝකය ඔබයි කිතු හිමී
අඳුරෙ දිලෙන පහන් සිළුව ඔබ මගේ දෙවි

අඳුර බිඳන් එළිය අරන් ඔබ එනු දිටිමී
පාළු ගතිය තනිය මකන් ඔබ ගුණ ගයමී
මිනිස් හදත් එළිය කලෝ ඔබ බව දනිමී
පහන දවන් එළිය අරන් ඔබ කරා එමී

## 64 – සප්ත සයුරෙ

සප්ත සයුරෙ අතර මංවූ
රුවල් බිඳුනු ජීවිත නෞකා
පාවී පාවී ඔබේ රුවන්
දිවයින වෙත ඇදී එන්න
පිහිට වනු මැනේ....

ජීවිත කඳු වැටියේ අතර මංවූ බැටළුවන් අපි
ඔබේ සිහිල් සෙවනල්ලෙහි
ලැගුම් ගන්න දෙන්න ඉඩ පියේ

සමාවෙලා සමිඳේ ඔබෙ නොසිඳෙන කරුණා ඇල්ලෙන්
අපේ නිසරු දිවි කතරට
අමා වතුර සලනු මැන පියේ

## 65 – දේව වචනයේ

දේව වචනයේ සවිය ඔබ ම වේ
දෙව් සමිඳුනි අපගෙ හදට කතා කළ මැනේ

දේව වචනයේ දිරිය ඔබ ම වේ
දෙව් සමිඳුනි අප දිවියට ඇතුළු වුව මැනේ

දේව වචනයේ සවිය ඔබ ම වේ
දෙව් සමිඳුනි අපට සවිය ලබා දුන මනේ

## 66 – ප්‍රේමය වේ උතුම්

ප්‍රේමය වේ උතුම්
සහෝදර ප්‍රේමය වේ උතුම් //

ප්‍රඥා ශක්තිය දහම් දෙසුමෙ බල
තිබුණද නැත පල ප්‍රේමය නැති කල

අන්‍ය භාෂා හා දිවැස් වැකිය වුව
සුවයේ දීමනා තිබුනද අයිතිව

මහ මෙර සොලවන විශ්වාසය හා
බලාපොරොත්තුව තිබුනද තිර ලෙස

පූජා කෙරුවද මා සතු සැම දේ
එහි ඇති කිම පල ප්‍රේමය නැති කල

ඉවැසිල්ලෙන් කරුණාවෙන් පූර්ණ වූ
සියලුම යහපත් ගුණෙන් අනූන වූ

## 67 – අදහම් වචනෙ ඔබේ

අදහම් වචනෙ ඔබේ
ජීවනෙ දෙන වචනේ
දිවමත් දෙවියන්ගේ
පුතා ඔබයි සමිඳේ

පස් බිමේ වැටී වැලලී
මැරී නොයන තුරු පැලවී
බීජය පොලොවෙන් මතුවී
නොනගී නොනගී නොනගී

එන්නට නම් මා පස්සේ
තම තමන් වරා ගන්නේ
ඇරගෙන තමන්ගෙ කුරුසේ
එනු එනු මා පසු පස්සේ

මකා ගන්නැ මා සඳහා
පණ ඔබෙ රැකැ ගනු පිණිසා
ඔබ මැ තකා ඒ රැකැලා
නැති කැරැ ගන්නේ නිති දා

## 68 – දේව වදන

දේව වදන කුරිරු දැහැමි සව් සත හට
නව එළියක් උදා කරනවා
කුරිරු දිවිය අඳුරින් බර අතීතයට
නව දහමින් වැළලී යනවා
පැසසුම් වේවා...

කිතුනු දිවිය කිතුනු සසුන
කිතු දනහට නිදසුන් වේවා
දේව වදන ජේසු තුමන්
අනුයන්නට දිරියක් වේවා
ආලේලූයා

යට ගිය දින අතපසු වූ නොම සිදුවූ
දේ ගැන නැත පසුබට වන්නේ
නව දහමක් සතහට දෙසූ දැහැමි ගුණැති
කිතු තුමනට තුති පසසන්නේ
පැසසුම් වේවා

## 69 – විලියට පත්වනු

විලියට පත්වනු නොදී කෙදා
ගලවනු මා, ඔබ දැහැමි නිසා
රැකුම සොයා ඔබ ළඟට වහා
දිවැ එමි මම් හිමි පා

ඔබේ සවන් මා දෙසට නමා
වඩිනු වඩිනු ළහියේ
මා මිදුමට සමිඳේ
වනු ඔබ මට සළ රකවරණේ
මට ඔබ ගැලැවීමේ
බලකොටුවද වන්නේ

සමිඳුනි ඔබගේ නම සඳහා
දක්වනු මට මග පා
අසකරගන්නට මා
අතුලෝ දැලකුත් සඟව තබා
එයි නොබ මා බේරූ
මගේ රකවරණේ වූ

අතට ඔබේ පණ හුස්ම මගේ
බාර කරමි සමිඳේ
ගලවනු මා දෙවිඳේ
තුසිම් නොහිමි ඔබේ මෙත සමරා
විපතෙදී මා නහමා
ඔබ මට පිහිට වූණා

## 70 – හද පත්ලෙන් මගෙ

හද පත්ලෙන් මගෙ එයි උතුරා මේ
කතා පුවත අගනා
පවසම් රජුනට කව් බසින් මගේ
රචනේ යසට ගොතා
පත් හිඳෙකින් මෙන් දිවෙන් මගේ ඒ
සුරුවට ලියැවෙනවා සරුවට ලියැවෙනවා

රජසුනො බේ දෙව්සුරුණෝ
සදහට ඒ පවතින්නේ //

ඔබ වෙති අති රූබර සම්පතියෝ
මිනිස් පුතුන් අතරේ
ඔබ තොල් මතුපිට වගුරනු ලැබුයේ
පහන් වරම් ආසී
එහෙයින් ඔබ පිටැ සදහට සුරිඳෝ
සෙත් ආසිරි පැතුවෝ සෙත් ආසිරි පැතුවෝ

කඩුව ඔබේ ඉණ වටැ බැඳැ ගන්නේ
තෙද බලවතාණනේ
තෙද ඔදින් වැඩී, අසු පිටේ නැගී
යනු දියකුරු ගමනේ
ඇත්ත, දැහැමි බව, සැදැව සඳහා
යනු දෙස් දෙන්න හිතා යනු දෙස් දෙන්න හිතා

## 71 – පෙන්වනු පෙන්වනු

පෙන්වනු පෙන්වනු මට දෙවිඳේ
ඔබෙ කරුණාබර කඳ මහිමේ
මගෙ අත් බව ඔබ ළඟ ඇසුරේ
සොයා ගනී ඔබෙ රැකවරණේ

ආකාසේට වඩා
උසිනො'බ වැජැඹෙත්වා
ඔබෙ යස දෙවිඳාණෝ
පැතිරේ දෙරණ පිටේ

සොයම් සොයම් ඔබෙ තටු සෙවණේ
ඒ මගෙ පිළිසත් තැන වන්නේ
ගෙවී නොයන තුරු විපත් විනේ
සිටිමි සොයා ඔබෙ පිළිසරණේ

මහ  උතුමාණන් වන දෙවිඳේ
මගෙ පරමත් දෙවිසුරාණනේ
මට යහපත සලසුවාණනේ
ඔබටඬොඩගා මම් සිටිමි අනේ

උගුලක් මා ගන්නට ඇටවූ
මගෙ අත් බව උං තුමූ මැඩූ
මා දමනට වළකුත් හැරූ
යෙත්වා ඒ වළෑ වැටී උනු

## 72 – සමිඳුන් ජනතාවේ

සමිඳුන් ජනතාවේ
අසව් අසව් හොඳ හැටි කන්දී
ඔබ අමතා යළි යළි අමතා
කියති මෙසේ සමිඳරුවාණෝ

මම වෙමි ඔබව මවාලූවෝ
මම වෙමි ඔබව හදා වැඩූවෝ
මම වෙමි ඔබව මුදා ගත්තෝ
නොපැකිළෑ සිටිව් නොබා //

ගතිමි ඔබව මා ළඟට'ඬගා
ඔබේ නම කියා කියා අඬගා
ඔබයි ඔබයි මා සතු උරුමේ
ඔබ මගෙ අයිතිය වේ //

මම වෙමි ඔබෙ සමිඳරුවාණෝ
ඔබෙ පරමත් දෙව්සුරාණනෝ
සුවිසුදුවෝ මගෙ ජනයාගේ
මිදුම් කරුවො ඔබගේ //

## 73 – අරකිනු මා අරකිනු

අරකිනු මා අරකිනු දෙවිඳ
ඔබ මට කෙම් බිම වූහ මගේ
දෙවියනි ඔබ වෙති මගෙ සමිඳො
මගෙ සැපතේ සුළ මුල ඔබවේ

උරුමේ කොටස මගේ
විත මගෙ ඔබ සමිඳේ
ඔබ ළඟැ ඇසුරේ සුරතේ හෙවණේ
මගෙ තොස ආනන්දේ

එතුමන් දෙස් ගතවුන් සඳහා
විස්මකුරුයි සැලකුම් ඔබ පෑ
ඒ හිතවත් පින්වතුන් නිසා
මගෙ හැම අසා පිරිමැසුණා

උරුමෙ කොටස මගෙ විත සමිඳො
මගෙ අයිතිය ඔබ නිති රක්නෝ
රමණී පෙදෙස් මට වෙන් කෙරුවෝ
යස තැන් මට හරි කැරූ දුන්නෝ

## 74 – යුද්දෙට අත් මගෙ

යුද්දෙට අත් මගෙ පුහුණු කරන්නේ
රණසූරු කෙළියට ඇඟිලි මගේ
මගෙ සල වන ඔබ සමිදරුවානේ
සුබ සෙත් ආසිරි ඔබටත් වේ

ඔබ මගෙ සාගරෙ කරුණා වේ
ඔබයි මගේ බලකොටුවේ
ඔබයි ඔබයි මගෙ රකවරණේ
ගැලැවුම් කරුවෝද මගේ

පලිහත් මගෙ පිලිසත් තැනො'බේ
යට කැරු දෙති මට ජනයා
තකතට යම්තම් වත් මිනිහා
කවුරුද හේ නම් සමිඳේ

මිනිස් පුතකු හැටියට ඔබගේ
සිහියට ගන්නට කවුදේ
හෙලන හුස්මකට හේ සමවේ
ඔහුගෙ දවස් හෙවණැල්ලේ

## 75 – හිරු උදා වැලා

හිරු උදා වැලා
නොයන තුරු බැසා
සමිඳුන් නම පසස ගොසින් වනව් බබුළුවා
ආලේලූයියා ආලේලූයියා

පසස සිටිව් සමිඳුන් මෙහෙකරුවනේ
පසස සිටිව් නම හිමි පා සඳුන්ගේ
හිමිපාණන් නමට දැනුත් නිති දිනේ
ගරු බුහුමන් සෙත් ආසිරි ලැබෙන්නේ

අදිපතියෝ වෙති සමිඳෝ මුළු ලොවේ
එතුමෝ වෙති මහිමෙන් මහා උතුමාණෝ
අප දෙව් සමිඳුන් සමාන කවුරුදෝ
ඉහළ තැන්හී අසුන් අරා සිටින්නෝ

ඉහළ පහළ දෙලොව ඇසැ'ර බලන්නෝ
පහත වැටී ඉන්නන් යළි නගන්නෝ
කසල ගොඩින් දිළිඳුන් ඇදැ දමන්නෝ
රජ කුමරුන් ඇසරෙහි උන් තබන්නෝ

## 76 – දෙසට කඳුකරේ

දෙසට කඳුකරේ
නගම් ඇස් මගේ
එනු ඇතේ එතැනිනේ
උදව් පිහිට මා සොයා
අහස හා පොළොව හා
මැව්ව සමිඳුණේ
මගෙ සහයට ඔබ මැ වඩින්නේ

දෙපා හැපි නොවැටෙන ලෙස එතුමෝ ඔබ රකින්වා
ඔබෙ මුරකරු එතුමාණෝ ඔබ නිති මුර කරන්වා
එතුමන් නෑ කවදාවත් නිදි කිර කිර සිටින්නේ
ඊස්රයෙලුන් රකින්නෝ නො නිදිති කිසි දිනක හෝ

සුරකු, ඔබට ඔබට හෙවණ, සුරිඳෝ වෙති නිති පතා
රකවරණය ඔබට දෙන සෙ, ඔබ සුරතේ සිටින්නෝ
රෑ යාමේ සඳුගෙන් වන විපතින් ඔබ මුදන්නෝ
දිවා හිරුගෙ උවදුරින් ද එතුමෝ ඔබ රකින්නෝ

ඔබට විඳින හම නපුරින් සුරිඳෝ ඔබ රකින්නෝ
ඔබගේ වන ආත්මයද රකිති ඔවුන් වහන්සේ
යන එන ගමනත් ඔබගේ සුරිඳුන් හට බා රවේ
ගෙවෙමින් යන දැනුත් මේ අදත්, හෙටත් නිතිදිනේ

## 77 – කන්කළු රස බර

කන්කළු රස බර ගීත ගයා
පියා සලා යන මිහිර සොයා
සිඟිති කුරුල්ලන් කවා පොවා
සමිඳුන් සුරකිති උන් සතපා

ලස්සන කුසුමන් පිපෙති කැලේ
ඕලු නෙලුම් හිනැහේ ජලයේ
විලේ පිපෙන සුදු ලිලී මලේ
ජීවය දෙවිඳුන් ගෙන් ලැබුනේ

තණමත රැඳි පිනි බිඳු විලසේ
ඇතිවී නැති වන ලෝ සැමදේ
නොසොයා දහසක් සැප ලොකේ
සොයමු සමිඳු පා සැප සගයේ

## 78 – වෙහෙසෙන්නෝ

වෙහෙසෙන්නෝ බර උහුලන්නෝ
එන්වා මා වෙතැ එන්වා
ඒ ඒ සියලුදෙනා කැඳවා
නිවමි ඔවුන් මම් සන්හිඳුවා

දහඅට වසරක් කුදු ගැහිලා
සිටි ඒ ගැහැනිට පිහිටවුණේ
සම්දුන් සුරතේ පහස ලබා
සුවපත් වූවා එ ළඳ වහා

සමාජයෙන් පිළිකුල් කැරුලා
ඈත් කරපු ලාදුරු දුගියා
ජේසුගේ පාමුලැ වැඳැ වැටිලා
කළ කන්කෙඳිරිය ළය තැව්වා

අඬා අවිත් පොලොවේ හැපිලා
දූගේ විපත අම්මා කීවා
නොසැලෙන ඇගෙ විස්වාසෙ තකා
ඇගෙ සිත සන්සිඳුවා යැව්වා

අබ්බාගාතය පැදුරේ තබා
උස්සා ගිය හැටි හතර දෙනා
වහළෙන් ගෙතුළට ඔහු බාවා
ජේසුට ආතුරයා පෑවා

කවුද අනේ අද සමාජයේ
අසරණයා හට අත දෙන්නේ
කොතැනද මෙවගේ අය නැත්තේ
අහක බලා ඇයි අප යන්නේ

## 79 – මා පියුමක් ලෙස

මා පියුමක් ලෙස ඔබ පාමුල පරව ගියාවේ
දූවිල්ලක් ලෙස ඔබ පායුග මත රැඳුනාවේ
මී බිඳුවක් ලෙස ඔබ දෙතොලට රසය වුනාවේ
තෙල් බිඳුවක් ලෙස ඔබ කෙස් මත මා ඇලුනාවේ

ඝන අඳුරට සඳ පහනය සමිඳුනි ඔබ අපටා
ඔබ වත මට දෙයි සහනය සැම සතුරන් පලවා
මගෙ සිරුරේ දිවයන රුහිරෙට ජීවය පොවනා
දුක් සුසුමක් ඔබ ඇති තැන මට සතුටක් දෙවනා

මඳ පවනක් ලෙස මා ගත වැද සිසිල ගෙනාවේ
ඔබ සීතල රැයකට මාහට උදුන වුනාවේ
ජේසුනි ඔබෙ නම මතුරා ගී කියමි නිරතුරා
රඳවා සෙනෙහස උතුරා ඔබමය මා මිතුරා

## 80 – මා සඳහා දිවි පිදුවේ

මා සඳහා දිවි පුදුවේ
මරණෙන් හෝ උත්ථාන වුණේ
ඔබ ඇරැ වෙන කවුදෝ කවුදෝ
ජේසු මගේ කිතු සමිඳේ

විත විපතට හෝ වේවා
දුක් වෙයිනට හෝ වේවා
කිතු සමිඳුන්ගේ ප්‍රේමෙන් හා
කාට හැකි දැ වෙන් කරනට මා

පීඩාවට හෝ වේවා
සාගින්නට හෝ වේවා
කිතු සමිඳුන්ගේ ප්‍රේමෙන් හා
කාට හැකි දැ වෙන් කරනට මා

දුගී දුකට හෝ වේවා
කඩු පහරට හෝ වේවා
කිතු සමිඳුන්ගේ ප්‍රේමෙන් හා
කාට හැකි දැ වෙන් කරනට මා

මරුවා හට හෝ වේවා
මොන බලවතාට වේවා
කිතු සමිඳුන්ගේ ප්‍රේමෙන් හා
කාට හැකි දැ වෙන් කරනට මා

සෙනෙහස දෙවිඳුන් අප වෙත පෑ
ජේසු තුමන් ගේ මුව මඩලේ
දිස්වන රඟ සියැසින් මැ බලා
කරමු අපේ ජීවිත පූජා

## 81 – දේව වචනයට

දේව වචනයට සවන් දුනිමු අපි
එමගින් අපහට, නව ජීවනයක් සැලසෙනවා //

එම වදනින් අපි ජීවිත හරි මග
ගෙන යන්නට අද සමිඳුන් පාමුල කැපවෙනවා

දේව වචනයේ රසය උරාගෙන
ඒ රසයෙන් අපි, සවිය ලබාගෙන පිබිදෙනවා

සුදතුම් ආසිරි වරම් දිනාගෙන එතුමන්
වරමින් නුවණ ලබාගෙන පැහැදෙනවා

## 82 – අපගේ ජීවිත රහසයි

අපගේ ජීවිත රහසයි
අපගේ ජීවිත අරුතයි
පෙන්වා දෙනුමැන කිතුසමිඳේ
අපි දිවි ගමනට එළිය ඔබයි

ඔබගේ කැපවුණු ජීවිතයේ
මග අප ගත යුතුවේ
අප දිවි ඔබගේ ජිවිතයේ
සලකුණ විය යුතුවේ

හරි මඟැ දිවි ගමනේ
එඩිතර විය යුතුවේ
මිනිස් වගේ සුව පිණිසැ අපේ
සිත් යොමු කල යුතුවේ

අගනා මානව ජීවිතයේ
තිසි පල ගත යුතුවේ
ජනතා සේවය පිණිසැ අපේ
දිවි කැප කල යුතුවේ

## 83 – ඇතින් ඇසෙනා

ඇතින් ඇසෙනා ඒ ගී රාවේ සමිඳුනි – ඔබේ පැසසුම් කියැවේ
කඳු වැටි පීරා  හමනා සුලඟේ සමිඳුනි – ඔබේ පැසසුම් කියැවේ

ජය ශ්‍රී වේවා පැසසුම් වේවා
සමිඳේ ඔබ නිති සැරදේවා

ගලමින් බසිනා ගඟ දිය රැල්ලේ සමිඳුනි – ඔබේ පැසසුම් කියැවේ
ගල් පරපීරා හැලෙනා අල්ලේ – ඔබේ පැසසුම් කියැවේ

සුලඟින් සැලෙනා බර වී කරලේ – ඔබේ පැසසුම් කියැවේ
දැල් ගොඩ ඇදෙනා ඒ සුදු වැල්ලේ – ඔබේ පැසසුම් කියැවේ

## 84 – දේව වදනට තුති පැසසුම් දෙව්

දේව වදනට තුති පැසසුම් දෙව්
තුති පැසසුම් තද සමිඳුට නංවව්

ආලේලූයියා //

කරුණා ගුණ ඇති දේව සමිඳුන් වදන පිළිගෙන අදර බැතියෙන
සමිඳු වර ඇති එගුණ වදනට සදා පින් දී දෝත නගමින

දෙපා ගමනට එළිය ගෙන දෙන අසිරි වදනින් දිරිය අරගෙන
දෙවිඳුන් හිතවත්වුන්ගේ කැලමෙන් සමිඳු ගුණදම් සදා වඳිමින

දෙලෝව අගරජ සමිඳු වණවග දෝත මුදුනින් බැතින් පිළිගෙන
පසස ගයමු සමිඳු දෙවිඳුට රකින බව හැම සමරමින් අප

## 85 – පසස පසස අත් බවේ

පසස පසස අත් බවේ මගේ
හිමි පා සඳුන් වනා
සමිඳේ මගේ දෙවිසුරාණනේ
ඔබ වෙතින් අති උතුමෝ

ඇඳුමෝ'බෙ මහිමා ලංකාරේ
ආලෝකේ ඔබෙ ආවරණේ
කූඩාරම ලෙසැ ආකාසේ
දිග ඇරලා තැබුවෝ ඔබ ඒ

දිය මතුපිටැ ඔබ ගොඩ නැගුවෝ
ඔබගේ කිලි ගබ උඩු මාලේ
වලාවො ඔබේ වාහන සැරුමේ
ඇවිදිති අත් තටු පිටැ සුළගේ

පවනෝ වෙති ඔබේ පණිවුඩ කරුවෝ
ගිනි ජාලා ඔබේ මෙහෙ කරුවෝ
පොළොවෙහි පදනම් මතැ නැගුවෝ
ඒ නොසැලේ කිසි දවසැක හෝ

## 86 – දහම් වැඩුමට

දහම් වැඩුමට සවන් දුන් අපි
දේව වදනේ හරය ඔබවේ
දිවි වඩා සොඳ ගුණෙන් යහපත්
එළිය කරවමු අඳුරු හදවත්

රැගෙන තේරුම් වදනේ හරයත්
කවා හදවත් තුළට සැනෙකින්
කෙමෙන් අප සැම නගමු පියමන්
දිනෙන් දින ඔබ කරා සතුටින්

## 87 – පියාණෙනි මාවෙත ආදරෙන්

පියාණෙනි මාවෙත ආදරෙන්
වඩාලන්න තිබඳ දරු සෙනින්
මියෙමි මම් පව් බරින්
පණක් දෙන්න ඔබගෙ අනුහසින්

දෑස ලදිමි ඔබ නිසා නොබැලුවෙමි මම
සවන් ලදිමි ඔබ නිසා නොඇසුවෙමි මම
කෙලෙස් බවින් උදම් වෙලා අඳුරේ ගැලුණු මම
දුවමි යළිදු ඔබගෙ තුරුළට

පියලි වියලි මිලින මලක් ඔබට පුදසුනේ
සසල හදට සුදුසු අතට නොවෙ ද පියෙ ඔබේ
කමා කරන් නිරා දුකින් එතෙර දකින ලෙසේ
ලයෙන් ලයට කුමරු වැඩින සේ

හෙටත් කියා දිනක් ඇතත් කඳුළු දකින විට
ලොවේ සියල් අසිරි සිරින් පලක් නැහැ මට
පියෙණි කියා සුසුම් හෙලා හඬක් නගන විට
ලඟින් ඉන්න ආදරෙන් මට

# 88 – අහස වෙතට

අහස වෙතට ඔසවන නෙත්
සැනසුම ලැබ පියවන තේක
ඉර සඳ තරු මැවූ දෙවිඳේ
ඉන්නෑ මා වෙතේ

හද ඔබ මගේ එක්වන තෙක්
නොම පියවෙයි මා සතු නෙත්
තුරු වැල් කඳු පෙළ අතරින්
එන්නෑ මා වෙතේ

දුකෙහි සතුට සුව සෙනෙහස
සදා ගෙනේවා
සහනය දෙන සුව උල්පත ඔබෙන් පිදේවා

පෙමක මහිම පිය සෙනෙහස සදා ගෙනේවා
අදත් හෙටත් සැමදා මා වෙතම රැදේවා

## 89 – ඔබ ඔබට මෙන්ම

ඔබ ඔබට මෙන්ම අන් අයටද ප්‍රේම කරන්න
ඒ ප්‍රේමය ආපසු පැමිණේ ඔබ සනසන්න

වෛරය ක්‍රෝධය දුරලා
එකමුතු වන්න
මා පමණක් නොවෙයි මිතුර
අපය සිතන්න

කිතු තුම සමිගින් මුළු ලොව
එළිය කරන්න
අප පමණක් නොවෙයි
හැම ගැනම සිතන්න

## 90 – සිහිවෙනවා සිහිවෙනවා

සිහිවෙනවා සිහිවෙනවා නිතර දෙවේලේ මට සිහිවෙනවා
ඔබ ගැනැ ඔබේ පුත් ජේසු තුමා කියාපු විසිතුරු විස්මත කථා
සගවැසි පියාණනේ, ඔබ මට සිහිවෙනවා

පියාගේ වග තුග මට හඳුනා දෙන්න හිතා ඔබ කීව කථා
ජේසුනි කොතෙකුත් සිහිවෙනවා සග වැසි පියාව මට පෙනෙනා

බාල අකීකරු පුතා එදා පියාව අත්හැර දමා ගියා
උපමාවක් ලෙසැ මා සඳහා කීව වගේ ඒ මට හැඟෙනා

පියාව අත් හැරැ දමා ගියේ ඈත්වෙලා දුර රටකට නේ
ඒ මේ සසරේ දුර කතරේ තනු මට හොඳ හැටි වැටැහෙන්නේ

පිතාට වුණු දේ මටත් වුණේ මොනවා හොයා මා මෙහි ඉන්නේ
ඉසුරු කියා මා මෙතෙක් අනේ සෙව්වේ වසුරුයි මගේ පියේ

පුතා එදා හොඳ සිහිය ලබා පියාද ගෙදර ද සිහිකෙරුවා
ඇයි යන්නේ මා මෙහි මැරිලා නැගිට්ම් යම් මම් පියා සොයා

මේ සසරේ මම මිදී එදා එම් ද පියේ ඔබේ වහල සොයා
මා එනතුරු ඔබ සුසුම් හෙලා ඇස් දිගු කැරගෙන සිටිති බලා

කවදා ඔබ මගෙ බෙල්ල බදා හාදු දිදී පිළිගන්නේ මා
මුදුවක් ඇඟිල්ලේ මගේ දමා මගුල් ඇඳුම මට පොරවාලා

සාදාකාල මංගල මෙසේ බොජුනට මා ලංකැරැ ගන්නේ
“නොදකින” දේ මා අදහන්නේ, අදහන දේ මා දැකැගන්නේ

ලැමේ එදා ආබ්‍රහාමුත්ගේ දුප්පත් ලාසුරු ලැගුණ වගේ
ඔබගේ තුරුල්ලේ මගේ පියේ සැතපෙන්නට මට කවද ලැබේ

ඔබයි මගේ හොඳ තාත්තානේ, මගේ නැ ගැලැවුම් ගුරු සමිඳේ
සුදත් සුරිඳු මගේ අසුවැසුමේ තියෙක දෙවිඳු මගේ ආනන්දේ

## 91 – අසුන් අරා

අසුන් අරා සගරජ දහනේ
වැජැඹෙන ඔබ තුමනේ
නගා සිටිම් මම් දැස මගේ

තම හාම් පුතුන් අත දිහා බලා
දසුන් සිටින ලෙසැ ඇස් හරවා
අත සාමිඳුව දෙසැමැ බලා
දැස්ස සිටින ලෙසැ අසුන් යොමා

ඉති, බලව් අපේ ඇස් සමිඳු කෙරේ
අප  පරමත් දෙව් සුරත් කෙරේ
ඇත ඔසවා නොබලන තුරු එතුමා
අප පිටැ කරුණා ගුණ එලවා

අනුකම්පා කරණු මැනව සම්දේ
පෙන්වනු අපටෝ’බෙ අනුකම්පා
නින්දාවට අප කොතෙකුත් පත්වි
ඇති සැටින් බලා අප ඉවසා

යස ඉසුරු දනන්ගේ ඇණුම් බැණුම්
නිසා පිරී ඇත අත් බව’පෙ
උඩඟු අයගේ නින්දාවේන් නොතිවා
ඇත අප සිත් කොතෙකුත් මැඩිලා

## 92 – පසස පසස සමිඳුණන්

පසස පසස සමිඳාණන් එතුමන් සාන්තුවරයේ
උසට පසස එතුමාණන් විකුමන් පිරි අහස් තලේ

විස්කම් එතුමාණන් පැ සඳහා වනව්ව එතුමා
එතුමන් මහා තෙද මහිමේ සලකා පසසව් එතුමා

හොරනෑ හඬ පිළිරුව් දී එතුමන් වනව් බබුළුවා
විහිණ වෙසෙස් එකතු වැලැ හිම්පා වනව් බබුළුවා

කිකිණි රබන් හඬට නටා සමිඳුන් වනව් ගොස ගොසා
නළා හඬින් තත් මැදුමෙන් සමිඳුන් වනව් පුන පුනා

අත්තාලම් ගැටුම් ගොසින් හිම්පා සිටිව්ව පසසා
අත්තාලම් එකට ගසා සමිඳුන් වනව් රුව් දෙවා

හුස්මක් ඇති සියල්ලෝ මැ සමිඳුන් පසස ගොසත්වා
ආලේලුයියා ඔහොයියා රුව්දී සමිඳුන් වනත්වා

## 93 – සමිඳුනි ඔබ මට

සමිඳුනි ඔබ මට වාසනා නිතරම ගෙන එනවා
ඔබගේ සෙනෙහේ මා වෙනුවෙන් සැමදා ඉතිරී යනවා

ඔබ මගේ අත අල්ලාගෙන ආදර තාත්තා ලෙස මාගේ
උතුරා යන සෙනෙහසකින් මා නිතරම සුරකින්නේ

සතුරන් මට විත කරන්නට තැනුවත් නැහැ මම බය වන්නේ
ඔබ මා නපුරෙන් සුරකිනවා නොසැලන පවුරක් සේ

ජල මැද ගිනි මැද යන්නට වූවත් නැහැ මම බය වන්නේ
කොහේ සිටියත් මගේ නම කියලා ඔබ මා අමතන්නේ

ඉර හඳ තිවුණත් අඳුරු වූවත් ලොව කුමටද පැකිලෙන්නේ
ඔබමය අඳුරට ආලෝකේ පහන් ටැඹක් වාගේ

## 94 – සුවඳ දිදි පිපුණ උදේ

සුවඳ දිදි පිපුණ උදේ සෙව්වන්දියක් වගේ
නිමල බවේ සුවඳින් මා පුබුදනු මැන සමිඳේ

දෙපයට පෑගෙන අවිහිංසක උදුපියලි කොළේ වගේ
මා අවිහිංසක කළ මැන සමිඳුනි ඔබේ හදවත වාගේ

හිරු දැකලා ජලයෙන් පිටතට ඇදෙනා නෙලුමක් වාගේ
පාප බවින් මා පිටතට ගත මැන දකිනට වත ඔබගේ

## 95 – අමතක නොවේ

අමතක නොවේ කිසිදා
ඔබව මට අමතක නොවේ
සියල් ජනයෙනි ඔබේ හැඩරුව
මා අතේ අඳිලා අතේ

මමක හට තම සිඟිති දරුවා
මතක නැති වේදෝ
ඇයට අමතක වූවද, මා හට
ඔබව අමතක වනු කෙසේදෝ

ලියක කුස තුල වැඩෙන බිළිඳා
මතක නැති වේදෝ
ඇයට අමතක වූවද, මා හට
ඔබව අමතක වනු කෙසේදෝ

පියකු හට සුරු බුහුටි සිය පුතු
මතක නැති වේදෝ
ඇයට අමතක වූවද, මා හට
ඔබව අමතක වනු කෙසේදෝ

## 96 – දෙවිඳුන්ගේ වචනේ

දෙවිඳුන්ගේ වචනේ
අපි මෙනෙහි කරමු උදයේ හවගේ
හාමත පවස හිතේ
සන්සිඳේ, නිවෙ, සුවවේ

සදා සෙනෙහසින් දෙව් සමිඳෝ
ප්‍රේම කළෝ මට ප්‍රේම කළෝ
එසේහෙයින් හිස් අගාධයෙන්
මා ඇදලා ගොඩටමැ ගත්තෝ

කිතු සමිඳුන් තුල මැරුණු බැවින්
දෙවියන් තුල වෙයි දිවි අපගේ
සමිඳාරුවාණන් මා සමගින්
ඇති ඇති සැඟවී එහැම පිටින්

නැගිටැ වදාලෝ කිතු සමිඳෝ
තුන්වැනිදා කී ලෙස එතුමෝ
මැරුණෙමු නම් අපි සමග කිතුන්
ජීවත් වන්නෙමු තුල එතුමන්

## 97 – වටහා ගන්නට

වටහා ගන්නට වැඩි වැඩියේ
ඔබගේ දිවමන් වචනේ
දෙනු මන අපහට එළිය ඔබේ
කිතු හිමිපාණනේ

ඔබේ වචනය තුල හදද ගැහෙන්නේ
නෑ අප තේරුම් ගන්නේ
සුදතුම් වරමින් අප පුරවනු මැන
එවිට'ප සිත් පැහැදෙන්නේ

අසෙන නමුත් බිහිරිය අප දෙසවන්
පෙනුනත් අඳුරුය දෙනුවන්
අප බිය සංකා දුරු කර සැණෙකින්
සැරසෙමු ඇදහිලි සිතකින්

## 98 – දේව වචනේ

දෙව වචනේ අනුහසින් මගේ හදට තට්ටු කරන – ජේසු සමිඳුනේ
මගේ දිවිය එළිය කරන පහන වනු මැනේ

මහද තුලට ඇතුළු වී ඔබගෙ රජය පිහිටුවන්න – ජේසු සමිඳුනේ
ඔබේ පෙමට දෙත් දෙන්නට වරම් දෙනු මැනේ

සිහිය නුවණ යොදවලා නියම දැක්ම ලබා ගන්න – ජේසු සමිඳ
ුනේ
වැරදි මගින් මිදි ගන්න සහය වනු මැනේ

## 99 – දෙව්දූතයන්ගේ හඬ

දෙව්දූතයන්ගේ හඬ අපට ඇසෙන්නේ
රළ මුහුදේ නැගෙන හඬින්
එතුමෙන් තෙද බල අපට හැඟෙන්නේ
දිලිසෙන ඒ ළහිරු රැසින්

පිබිදෙන්නැ තනිකට සොයුරු සොයුරියනි
මා මැවූ දෙව්දූත් හමුවන්න
නිදි ගැට හැරදා එතුමැන මිතුරනේ
මනු දිවියේ රස විඳගන්න

දෙව්දූතයන්ගේ පෙම අපට දැනෙන්නේ
සිඟිති ළමා සතුට තුලින්
එතුමන් මියුරස අප සතසන්නේ
ටකිරි සිනා නගන රැවින්

## 100 – ජීවිතේ මට දුන්නු

ජීවිතේ මට දුන්නු දෙවිතුමනේ
මගේ පණනල ඔබ අතේ රැඳුනේ
රැක ගන්න සමිඳුනි මා ////

සතුරු අනතුරු මාවටේ එන්නේ
රුදුරු බියකරු සතුන් විලසින්නේ
රැක ගන්න සමිඳුනි මා ////

හිරු උදාවී දවස ඇරඹෙන්නේ
දිවිය ගෙවුමට මා වෙහෙස වන්නේ
රැක ගන්න සමිඳුනි මා ////

අඳුරු සිතුවිලි වලින් වට වෙන්නේ
දුක් සුසුම් පැරදුම් වෙලා ගන්නේ
රැක ගන්න සමිඳුනි මා ////

## 101 – දෙවිඳුගෙ මහිමේ

දෙවිඳුගෙ මහිමේ ලොව සැම තැන පතල වූනාවේ

සියල් ලෝතලේ ඔබ වැවූ සූරිඳුගෙ සරණේ
පතව් සැම දිනේ ජය ගොස පතුරව් දෙරණේ

ඉදිත් පසු නොබා වියතුම් පැතුම් සපුරණා
බලැති පියෙක් ඇත එලොවේ ඔබගෙ සෙත පතා

## 102 – අනන්තයේ දේව වදනෙනී

අනන්තයේ දේව වදනෙනී
දෙවිඳු සමග විසූ වදනෙනී
දෙවිඳුන්ම වූ දේව වදනෙනී
අපේ හදට කතා කළ මැනේ //

මුලු ලොව වැව් දේව වදනෙනී
මනු බව ගත් දේව වදනෙනී
අප ගැලවූ දේව වදනෙනී
අපේ හදට කතා කළ මැනේ //

අප හා විසූ දේව වදනෙනී
සැනදසුම දෙන දේව වදනෙනී
අඳුරෙහි බබලන දේව වචනයෙනී
අපේ හදට කතා කළ මැනේ //

අනන්තයේ දේව වදනෙනී
අතීතයේ ක්‍රිස්තු වදනෙනී
අද සුබ හසුනේ වචනයෙනී
අපේ හදට කතා කළ මැනේ

## 103 – දෙව් පියාණනී

දෙව් පියාණනී
ඔබේ අනන්ත මහිමය හා
අපේ නිත්‍ය ගැලවීම සඳහා
මේ නිර්මල පූජය පිළිගත මැනව

අපේ ජීවිතයේ වැඩ පලද
වෙහෙස මහන්සිය හා ප්‍රතිඵල ද
ඔබට මුළු මෙන් කැප කරමු

ගැලවීමේ පාත්‍රය ඔබට පුද කරමු
අපේ දුක් වේදනා හා කඳුළු ද
එයට මිශ්‍ර කරමු

දයාභරිත ස්වාමිනී
මේ ලොවේදී ඔබ දයාව ද
එලොවේදී ඔබ දර්ශනය ද
දුගී වූ අපට දුන මැනව

## 104 – මේ අප පුදන පඬුරු

මේ අප පුදන පඬුරු ලබා ගන්න බලැති දෙවිඳුනේ
මේ දින සමාවන්න අපේ කිලිට් බව දැනේ

සියලු බලැති දේව රජිඳු සමඟ වසන ජේසුනේ
නෙතට ගැටෙන සුසුදු පූප වෙසින් එනු මැනේ

මෙදින අපට ලැබෙන කඳුළු සතුට මුසුව පුදනසේ
එදින ජේසු හැලුව රුහිරු සමඟ දෙනු මැනේ

## 105 – සියලු බලැති දෙවිඳුනේ

සියලු බලැති දෙවිඳුනේ
මේ පඬුරු පිළිගනු මැනේ
අප නුසුගුසු බව දැනේ
කමා කළ මැනේ

පඬුරු පුදන්නේ හිමි නමදින්නේ //

ඔබ දෙව්බව තුළට වී
එක්වන ලෙස අප දිවි
මිදිරස පැන් මුසු වෙවී
පිදේ සුවඳ වී

## 106 – දෙවිඳුනි ඔබ හට වඳිනු සදා

දෙවිඳුනි ඔබ හට වඳිනු සදා
ඔබ පුතු පඬුරම පුදමු මෙදා
දිවි දෙන පූපය මෙන්න අපේ
මිදිරස සිරිලෙය ගන්න පියේ

දෝතට අරගෙන පඬුරු කරන්නට
ඔබ වෙත රොක් වෙමු ජය ශ්‍රී පතුරා
රස පැන් මිදි රස හා මුසු වී
මනු බව සඟවයි දේව බවේ

ජේසුනි හද තුළ අප සඟවා
දෙවි දරු කරන්න පවින් මුදා
දිවි දෙන පූපය මෙන්න අපේ
මිදිරස සිරිලෙය ගන්න පියේ

සැම රසයෙන් ගෙන මිදිරස බේරා
ආවෙමු පුදනට පූපය තනවා
දෙවි බව දක්වමු ලොව සැමටා
හොඳ හිත පාමින් දෙවි පිනෙනා

## 107 – කල්වාරියේ ලෝ පව් නිසා

කල්වාරියේ ලෝ පව් නිසා
දෙව්පුත පිදූ ඒ යාගය මෙයයි
පූ සිරුර වේ ලේ මිදි රසයි
මේ නවක පූජාවේ පඬුර වේ

මේ මහගු වූ යාගය සමිඳුනේ
ලෝ මුක්තියේ
ලකුණ සේ ගනු මැනේ

## 108 – බාර ගත්ත සමිඳුනේ

බාර ගත්ත සමිඳුනේ
හැම නිදහස මගෙ සිතේ
සිහිය නුවණ මනාපේ
පිළිගනු මැන සියලු දේ

මා සතු හෝ මවැති හෝ
හැමෙක ඔබෙන්ම ලැබුවේ
ඒ හැම පිටින් යැළිත් ඒ
පවාරා දෙමි අනටො බේ

අනට ඔබේ පාලනේ
සඳහා දෙමි සියලු දේ
කරන්නැ ඔබ කැමැති සේ
මගේ කැමැත්ත නොවෙ ඔබේ

## 109 – පුදමු පඬුරු

පදමු පඬුරු ඔබෙ සිරි නමටා
දෙව් පිතුරුනි කුළුනු සයුරෙනි
මේ අප පඬුරු පිළිගනු මැනවී

ජේසුගේ සිරි සිරුරටා, මේ සුදු පූපය හරවා
අපට ජීවනය දෙවා

ගැලවීමේ පාත්‍රය, ජේසුගේ රුධිරය
සව් දනන්ගේ ගැලවීමය

# 110 - තුතිවේ දෙව්පියේ

තුතිවේ දෙව්පියේ සගයේ නිති දිනේ
තුතිවේ දෙව් පියේ වැජඹේ අප හදේ

අපගේ පඬුරු ඔබට ප්‍රිය වුනී
ඔබගෙ කුමරු අපට ඔබ දුනී

මනුකය ගත් දෙව් පුතුගේ
දෙව්කය අප ජීවය වුනේ

## 111 – සියලු බලැති දෙවිඳු සමග

සියලු බලැති දෙවිඳු සමග එක් වුනා
සමගි දමින් අපි දු ළං වුනා
එකතු වන්න යන්න එන්න සැම දෙනා
සාම මිහිර දෙන්න සත වෙතා

අම්ල පඬුර දෙවිඳු පිදුව අප වෙතේ
එකම පුත්‍ර ජේසු කුමරුනේ
ලොවට ගෙනා සාම මිහිර දෙනු මැනේ
සාම සුවඳ දසත යන ලෙසේ

සාදු නාද දෙන්න සතුති සැම දිනා
රසැති බොජුන් පිදුව පියනටා
ගතට සිතට අහර අපට පුදම්නා
අපේ දුබල පඬුරු පිළිගෙනා

## 112 – පිළිගෙනැ මේ පූජේ

පිළිගෙනැ මේ පූජේ
හරවා මසට ඔබේ
යළි මා වළඳන්නේ
හාමත නිවා මගේ

මිදි රස කැසලානේ
බාර ගන්නැ සමිඳේ
ලෙයටො’බේ හරවා ඒ
පොවන්නැ පිපාස මා

## 113 – අප සතු සැම දේ

අප සතු සැම දේ ඔබ වෙත ගෙන එමු
මේ යාගික මොහොතේ
මල් පළතුරු හා රන් මිනි මුතු හා
පුරවා අප දොහොතේ
මදුමය ගී හා සුන්දර දේ ලස්සන හිතකර දේ
ඈ ඒ හැම දේ ඔබ වෙත ගෙන එමු
තුති දී සුහද සිතේ

කොයි දේ පිදිණිද මගේ සිත නොපිරේ
නොවටී දූවිලි සේ
මිණි මුතු මැව් ඔබ ඉර හඳ මැව් ඔබ
මුළු මහා තරු පෙළ සේ
රිසිවෙමි මගෙ මුළු දිවිය පුරා
මගෙ ආදරය දරා
ඔබ ගැති වන්නට සියළුම මොහොතේ
ගැන ගැන පැය දවසේ

## 114 – මගෙ ආදර හැම හැඟුමම

මගෙ ආදර හැම හැඟුමම මිණිකැට කරවා
හැඩ වැඩ කල රන් තැටියක් ඉන් ගෙන පුරවා
මහ මුහුදේ රැලි පතුලේ මුතු කැට ගරවා
ඔබ පුදනෙමු මේ හැම රන් කොතකට හරවා

අප සතු සැම දේ ඔබ සතු වේවා
ඔබ සතු සැම දේ අප සතු වේවා

ගැයුමෙන් එන බැති මතුවන ගී වැල් මාලා
වැයුමෙන් එන සිත රසවන ඉමිහිරි ලීලා
කවියෙන් එන සිත කකයන ආදර පාලා
ඔබ නමදිමු මේ හැම දේ බිලිකොට දීලා

## 115 – ඔබ සමගින් යාග වන්න

ලොකේ පවිනිසා දිවි පිදූ සමිඳුනේ

ඔබ සමගින් යාග වන්න එන අප සැම බාර ගන්න
බාර ගනු මැනේ එන අප සැම බාර ගනු මනේ

පූප සමග ඔබට පිදෙන දුබල අපගේ ජීවිත සැම
බාර ගනු මනේ ජීවිත සැම බාර ගනු මැනේ

මිදිරසයෙන් හඟවන අප ශ්‍රම ශක්තිය ඔබට පුදමු
බාර ගනු මනේ ශ්‍රම ශක්තිය බාර ගනු මැනේ

මුළු දිවියම ඔබට පුදන මේ අප පඬුරු සැම දෙයම
බාර ගනු මැනේ සැම දෙයම බාර ගනු මැනේ

## 116 – අපගෙ පඬුර වේ

අපගෙ පඬුර වේ මේ යාගයේ ඔබට පිදෙන
පඬුරු අපගෙ ජීවේ ලකුණ වේ

අඳුරු ලොවට එළිය දෙන්නේ සමිඳු ඔබ ම වේ
ඔබ රුහෙනේ රැඳී ඉන්න දෙන්නැ ආසිරි

කඳුළු වලට සතුට දෙන්නෙ ඔබයි සමිඳුනේ
ඔබ ඇසුරේ දිවි ගෙවන්න දෙන්නැ ආසිරි

දුබල බවට සවිය දෙන්නෙ ඔබමය සමිඳේ
සබල බවින් දිවි ගෙවන්න දෙන්නැ ආසිරි

## 117 – සාර කෙතේ

සාර කෙතේ තිරිඟු කපා අටු පුරවාලා
තිරිඟු කොටා පිටි සදලා පූප තනාලා
දහදිය ශ්‍රම කය සිත සැම එයින් නහවලා
පුදනෙමු අපි මනු දිවියත් පූපෙට හරවා

ගන්න අප පඬුරු සකල දෙවිඳුනේ
දෙන්න ඔබේ වරම් අපට අද දිනේ //

මිදි උයනේ මිදි වවලා පොකුරු පිරිලා
ඒ මිදි ගෙන රස කරලා මිදියුෂ සදලා
ප්‍රීතිය සහ දුක සැප යන හැඟුම් මුසුවෙලා
පදනෙමු අප මනු දිවියත් මිදයුෂ කරලා

පුදසුන මත පඬුරු තබා පෙම් බැති පාලා
සොයුරන් හා එක් වෙමු අපි වරමක් ඉල්ලා
පූපය සහ මිදි රස ඔබ පුතුගේ සිරුරටා
හරවන මෙන් අප දිවියත් කැපවෙන ලෙසටා

## 118 – මල් සුවඳේ

මල් සුවඳේ නැගලා
එම් මම ඔබව සොයා
තරු වැල් බැඳ ගෙන
ඉර හඳ ඇඳ ගෙන
බබලා ඔබව සොයා

මී දුම හා මුසුවී
එම් මම ඔබව සොයා
එතුම් වදයේ – පැණිගෙන උදයේ
එම් මම ඔබව සොයා

කුරුළුන් කැදැලි සොයා
ඉර නැති සැන්දෑවේ
යනසේ එම් ඔබ – එම් මම යම් ඔබ
හිම් පා ඔබව සොයා

මගේ මල් දිවිය නෙලා
මසුරන් බඳුනක ලා
සුවඳ ලාවු හා පරාග එහිලා
ගෙන එම් ඔබව සොයා

## 119 – මොනවට ඔබ මට පඬුරු ගෙනාවේ

මොනවට ඔබ මට පඬුරු ගෙනාවේ
කිළිටි නේද ඔබේ හිත ඇතුළේ
සහෝදරය හා ඔබේ හිතේ
කහට බැඳි ඇත අමනාපේ

පූදසුන ළඟැ ඔබේ පඬුරු තියාලා
සොහොයුරු ඔබගේ යන්නැ සොයා
එන්නැ ඔවුන් හා සමගි වැලා
පිරිසිඳු සිතෙකින් පුදනට මා

## 120 – මගේ ජීවිතේ

මගේ ජීවිතේ රකින මේ පූජේ
ලෙසට පණ මගේ පුදමි අතටො'බේ
එහි ඔබ සමිදේ මාංශ ගත වී
වඩ වඩා ඔබේ පණ මට දෙන්නේ

මා ගත රුැහිරේ ලකුණේ මිදි රසේ
එයද ඔබ අතේ තබමි මේ විතේ
එදා වගේ මෙදා තුස්ම ඔබෙ හෙලා
හරව ලෙයටො'බේ පොවනු මැනවි මා

## 121 – සදාතනේ සදාණනේ

සදාතනේ සදාණනේ //
දෝතෙ හොවා ගෙන එන්නේ
අප දුක සැප සතුට කඳුළ //
කර පින්නා ගෙන එන්නේ
අප වැඩ පල සහ ප්‍රතිඵල

ඔබට පුදන්නේ අප
පඬුරු ලෙසින්නේ
පිළිගන්න’ප සමිඳේ

අප ආදර දෙමාපියන්
නෑයන් හා හිත මිතුරන් //
තැලෙන පෙලෙන කම්කරුවන්
දුගි දුප්පත් අසරනයන් //

ඔබට පුදන්නේ අප
පඬුරු ලෙසින්නේ
පිළිගන්න’ප සමිඳේ

## 122 – පූදසුනේ පිදෙන මේ

පූදසුනේ පිදෙන මේ තුටු පඬුර මෙදා
කුරුසියේ පිදුන ඒ බිලි පඬුර එදා

අපෙ ගත සිත පඬුරු සමග දෙවිඳුන් පුදමු
අයහපතින් මිදෙන ලෙසට නිත අපි යදිමු

දෙවියන් තුළ සැම දෙන මෙන් එක් අයෙක් වෙමු
යදිමු යදිමු අපි සැම දෙන දෙවිඳුන් යදිමු

## 123 – ලොව මැව් දෙවිඳුට

ලොව මැව් දෙවිඳුට පුදමින් පඬුරු
ගයමින් තුති ගී පුතුනට මිතුරු
මිදි රස පූප ද සමග මැ ඉසුරු
ඔබට පුදමි මේ තුති පඬුරු

ගන්නැ පඬුරු ආදර දෙවිඳේ
අප දිවි හා එකටෝ'ක් කරලා
ගන්නැ පඬුරු ආදර දෙවිඳේ
ඉපැදුන හෙවනද රුඳැවෙන මව් බිම
කිරි දී වෙහෙසි දැඩි කැලැ මව් පිය
ඒ කුසින් බිහිවුන මගෙ සොහොවුරු කැල
පුදමි ඔබට ආදර දෙවිඳේ

රට ගම අද පාලක පුගුලන් සැම
සිප් සත සැලසූ සොඳ ගුරු හිමි සැම
රට සරසන මිතු මිතුරියො ආදර
ඔබ පුදනෙමි ආදර දෙවිඳේ

ආදරයෙන් එක්රුස් වී සැමදෙන
ආදර හදකින් සැම හා යදිමින
අප සතු සැම දැය ඔබ වෙතැ අරුගෙන
පුදමි ඔබට ආදර දෙවිඳේ

## 124 – පවට නැමුනු

පවට නැමුනු අප වෙතැ මෙත් පැ
පෙම් කරුණබර පියාණනි
මේ පඬුරු පිළිගෙන අමිල පඬුරු ඔබ

## පුතු හා අප වෙත වඩිනු මැනේ

ආදරයෙන් අප එක්වීලා
කරුණා ගුණ ඔබ පසසාලා
ගැති අප පව් ගැන දුක් වීලා
පඬුරු පුදමු අපි සැනසීලා

අප ආදර මව්බිම උදෙසා
එහි වෙසෙනා සැම දන උදෙසා
පාලන කරනා අය උදෙසා
යදිමු ආසිරි මේ සැම උදෙසා

අපට ද අප ආදර සැමටා
අප පවුලේ සියලුම දෙනටා
මුළු ලොව අසරණ දනන් හටා
දෙනු මැන ආසිරි සැම දනටා

## 125 – පෙමින් පිදුන ඔබේ දිවිය

පෙමින් පිදුන ඔබේ දිවිය කුරුසෙ මත එදා
ලෙයින් ඔබේ  දෙව්නි අපේ පාපි බව සදා
අතින් අපේ පිදෙන පඬුරු සමග දුක් කඳා
බැතින් බරවූ පුදමු ඔබට ආදරින් මෙදා

මෙන්න අපේ තිළිණ ඔබට අප මෙදා
රැගෙන දෙන්න සුහඳ සමිඳ ඔබේ පෙම් දයා
ඔබේ පෙම් දයා

දුකින යදින පුදන පව්වූ දුගී දනා මෙදා
නැමුන දණින් පුදා පුජේ පව් කමා යැදා
පිදෙන ඔබට මිදි රස හා සියලු දුක බෙදා
මෙන්න ගන්න රජිඳ අපේ ආදරින් මෙදා

දිළිඳු අපට නොමැත වුවත් මැනික් පුදනටා
දිළිඳු බවත් ආදරයත් වෙතෙ අපහටා
කිතුනු ඔබයි දිවි දුන්නේ පාපි සතහටා
දිළිඳු සැමෝ ආදරයෙන් පිදෙයි ඔබහටා

## 126 – ජේසුන් මගෙ දිවිය

ජේසුනි මගෙ දිවිය එළියක් කළ මැනව
අඹරේ  දිලිසෙන රිදියෙන් නිමැවුන
නොනිවෙන තරුවක් සේ

ඔබගේ වරම් ලැම වැඩෙම් මේ මා
සරණ වෙන්න මගේ සොයුරු සැමා

ජේසුනි මගෙ දිවිය පඬුරක් කළ මැනව
උදයේ පොපියන පඹරුන් රොක්වන
සුවඳැති පියුමක් සේ

ජේසුනි මගෙ දිවිය වරමක් කළ මැනව
සැමහට හිමිවන සගයට ගෙනයන
ඔබේ පෙම් තිළිනක් සේ

ජේසුනි මගෙ දිවිය පියුමක් කළ මැනව
පව් දොස දුරුලන ජීවය ගෙන දෙන
කුරුසියේ යාගය සේ

## 127 – රත්තරන් මුතු

රත්තරන් මුතුමැණික් ඔබහට
පුද කරන්නට අත නැතේ
ආදරය හා අපේ හොඳ හිත
බාර ගනු මැන සමිඳුනේ

ළමා අපගේ ජීවිතය හා
දැනුම ඉගෙනුම ඔබ අතේ
තබා අපි සැම තුරුළු වන්නෙමු
ඔබේ කරුණා හදවතේ

අපේ මව්පිය සොහොයුරන් හා
මිතුරු කැල හැම ඔබ සිතේ
තබා රැක ගෙන සතුට සොම්නස
දෙන්න සැමටම දෙව්දුනේ

## 128 – සුවඳ සපිරි

සුවඳ සපිරි පිපෙන මලක් මම නෙලන්නේ නෑ
මහද මිහිරි පුරන හදක් මම පෙලන්නේ නෑ
සමිඳ අසිරි නසන බවක් මම පතන්නේ නෑ
පැහැද කිහිරි නැගෙන කලෙක් මම පිදෙන්නේ නෑ

ජීවිත පූජා පූජාසනේ //

දුලි මැදින වෙහෙස කඳුල පියවි ජීවිතේ
කැපිලි පුරන දහස විපුල ජීවිතේ
ඉපිලි දුදන පහස සකල පියවි ජීවිතේ
විදලි පිදෙන පසස ලකල පියවි ජීවිතේ

අදම කුරිරු පිරුවේ බලැති ලොවට විත කලෝ
මැවුම මියුරු නැසුවෝ හදති ලොවට විත කලෝ
සුසුම වියරු සැදුවො නැගෙති ලොවත විත කලෝ
පැතුම සතුරු පැතුවෝ ගෙවති ලොවට විත කලෝ

## 129 – පූප ලෙසට

පූප ලෙසට අප ගෙන ආ අපගේ ජීවිතේ

ඔබ වරමින් පුරවනු මැන දෙව් පියාණනේ
පුරවනු මැන දෙව් පියාණනේ

රුධිර ලෙසට හරවන ලෙස ගෙනෙන මිදි රසේ

අඳුරු ලෙසට අප ගෙන ආ අපගේ ජීවිතේ

තිලිණ ලෙසට අප ලද අපගේ ජීවිතේ

දුකට සතුට එකට මුසුව ගෙවන ජීවිතේ

## 130 – සුවඳ මල් තබා

සුවඳ මල් තබා – පහන් දල්වලා
පුදමු දිව් අපේ – ජේසු සමිඳුනේ

අපි සැමා මෙසේ – එකට එක්වුනේ
ඔබ නිසා ම වේ – සාම කුමරුනේ

සුවඳ දුම් පුදා – රජකු බව කියා
වඳිමු ගී ගයා – සමිඳු ජේසුනේ

සමිඳු ගිය මගේ – යන්න අප වෙනේ
දෙන්න සැම බලේ පෙමැති ජේසුනේ

දයා පෙම් වඩා – මෙලොව සත වෙතා
දිනෙක සග පුරේ – සැපත ලැබ දෙවා

## 131 මල් පහන් පුදා

මල් පහන් පුදා පුදසුනේ තබා
මගේ හදේ සෙනෙහස මා ඔබට පුදනම්
සුහඳ සැවොම හා

මා අත් බව මගේ බවයි
මා සැනසෙන ආදරයයි
මා හද දිනූ සැම සුහදො
පූජාසනේ ඔබට පිදන්නේ //

මිනිස් උපත මා හට දුන්
පෙමැති අම්මා මගේ පියා
එක කුසහොත් සොහොයුරු කැළ
පූජාසනේ ඔබට පිදන්නේ //

කථා කරන වචන උගත්
ලියන කියන සිල්ප දුන්න
උගත් දැහැමි ඇඳුරු හවුල
පූජාසනේ ඔබට පිදන්නේ //

## 132 – දැත වෙහෙසා හෙලූ දහඩිය

දැත වෙහෙසා හෙලූ දහඩිය ඔබට කැප කරලා
රෑ දු නිදි නොලබා මහන්සිය නොතකා
ඔබට පුදනට පඬුරු ගෙන එම් සතුට පිරි හදනා

පඬුරු ගෙන එමු සතුටු හදිනා
දෙමාපිය හිත මිතුරු සැම හා //
ශ්‍රමය යොදලා දිරිය වඩලා //
පුදමු අප සතු සැම දේ ඔබටා

පුපේ ඔබ සිරිකයට හරවා
මිදිරසේ සිරි රුධිරේ පොහවා //
සමිඳේ ආදර එන්න මා හා //
එහැර මට නැත කිසිත් සැපතා

මෙහෙල තිජබිම රකින සමිඳේ
අපගේ ආදර තිඑක සුරිඳේ //
සුහද සමිඳේ පෙමැති දෙවිඳේ //
මුදනු මැන අප පවින නපුරේ

## 133 – මේ යාගික පිදුමේ

මේ යාගික පිදුමේ දෙවිඳුගේ පුත් රුවණෝ
අප ගැලවුම ඇත සැඟවී අභිරහසෙකි මේ
ගන්නැ දෙවිඳුනේ මේ පූප යේ
මේ පානයේ මේ යාගය

## 134 – හද බැති තුති මල්

හද බැති තුති මල් පොකුරු තිලිණ කොට
පුද දෙමු ඔබහට දෙව් සමිඳේ
මෙතෙක් ගෙවී ගිය අපේ දිවිය තුළ
ලැබූ දීමනා සමරමිනේ //

ඔබේ වචනයෙන් ඔබේම දහමෙන්
අපේ දිවිය සරු වී වැඩුනේ
ඔබේ බල්ම තුළ රැකවරණය තුළ
අපේ ගමන තිසි මං ගැනුණේ //

නිමක් නොමැති ආදර කරුණාවේ
උනුසුම ඔබගෙන් අප ලැබුවේ
සොඳුරු පෙමේ රත් දම්න් වෙළෙන්නට
දෙන්න වරම් තිරතුරු සමිඳේ //

මිනිස් ශ්‍රමය පිලිබිඹු කරදක්වන
පූපය මිදියුෂ ඔබට පිදේ
නව ජීවනයට අප ඔසවන්නට
දිවමන් සමිඳුන් සිරුර ලැබේ //

## 135 – හාමතේ

හාමතේ දුක් ගැහැට උසුලන
දහසකුත් අපේ සොහොයුරන්
සෝ සුසුම් හා පුපිකාවන්
ඔබට පුදෙනෙමු සමිඳේ

දිනෙන් දින රෝ බියෙන් පසුවන
අසරණුන් උණු කඳුලැලි
මිදි යුසට පැන් පොදට කලනා
පුදමු හිමි ඔබ  අභිමුවේ

## 136 – ඔබට පුදමි

ඔබට පුදමි ලොවේ සියලු සාර ජීවිතේ
ගසේ ගෙඩිද වලේ මල්ද ගොයම හා කෙතේ
විලෙන් විලෙට ගලා බසින ජීවනයේ ජලේ
සියලු ඉසුරු රඳා තිබෙන ගබේ ලෝ තලේ

කසුන් අසුන් තනා සඳුන් අඳුන් අනා
සුගන්ද දුම් උනා වඳිමි සදාණනේ

මුහුදෙ මසුන් වනේ සතුන් අහසෙ තරු එළි
ගඟෙ දොළේ කඩා හැලෙන පළිඟු දිය ඇළි
කැලය සුවඳ කෙරෙන මල් ද අතු ද කොළ දළු
උදේ ඉරෙන් රතට හැරෙන දහර අහු මුලු

## 137 – මට ආසයි

මට ආසයි මල් බඳුන් පුදන්නට
දුම් පූජා හැමදාම කරන්නට
හැකියාවක් නැහැ එසේ කරන්නට
සමිඳේ මා පුදනා දේ ගන්න මැනේ

සිහින ලොවේ මා සිතනා දේ
සැබෑ ලොවේ දී කරනා දේ
අනාගතේ මා පතනා දේ
පඬුරු ලෙසින් පුදමි බැතින් ආදර සමිඳානේ

ඩහබිඳු දෝතට පුරවාලා
දුක් කරදර සැම එක් කරලා
මොහොතක සතුටට මුසු කරලා
සතුටු සිතින් පුදමි බැතින් ආදර සමිඳානේ

## 138 – ලබා ඔබේ ඇරයුම්

ලබා ඔබේ ඇරයුම් සමිඳේ
ආවෙමි සාදෙට අපි මෙදිනේ
මංගල ඇඳුමෙන් සැරසී
තෙල් පිරුනු පහන් දල්වා //

පඬුරු පිණිස නැ කිසිත් ගෙනාවේ
තෑගි බෝග ලෙසැ අතට ඔබේ
පිරිසිදු හදවත් දෙමු අපගේ
අප තිවසේ දොර ඔබට ඇරේ

මල් පොඳුනකට අප කැඳවාලා
අපේ වතට වත දී අමතා
"මෙන්න දෙව අජබාලකයෝ
මෙන්න ලොවේ පව් හරින්නණෝ"

"මංගලට මේසට සමිඳාණන්ගේ
යන ඔබටැ ත වාසනා ගුණේ"
"ඔබේ දස මා නම් සුදුසු නොවේ
එකමැ වදනකින් මා සුව වේ"

## 139 – පූපය මිදිදිය

පූපය මිදිදිය පිදෙන පැයේ
දිව්දුන් කුරුසිය මත සැතැපේ
නැග කල්වාරිය ගිර දුක සේ
දිවි දෙමු යාගෙට යාගය වී
පණ දී යලි යලි පණ ගැන් වී

## 140 - රැගෙනෙමි මා සතු

රැගෙනෙමි මා සතු සියලු දේ
පඬුරු කරන්නට මේ යාගික මොහොතේ

මගෙ මුළු දිවිය ද, මගෙ දුක් කඳුළු ද
මගෙ ශ්‍රම ශක්තිය මා සතු ජීවය
පඬුරු කරමින් ආසිරි පතමින්
පිළිගන්නෙමි දැන් බැති අදරින්

මගෙ ආදර මව් බිම සිරි ලක් බිම
ඒහි වසනා සැම වැසියන් සමගින
පුදනෙමි ඔබහට මෙදින සැමමා
පිළිගන්නකෝ දැන් ඔබට පුදමි

මගෙ මව් පියෝ හා මගෙ නෑ සියලුන්
මගෙ හිත මිතුරන්, මගෙ හැම සතුරන්
පඬුරක් කරමින් ආසිරි පතමින්
පිළිගන්වමි දැන් සුහඳ සිතින්

## 141 – පැතුම් ලොවක්

පැතුම් ලොවක් සැබෑ වෙලා
ජීවිතේ අලුත් වෙලා
ආදරේ හදේ පුරා
ප්‍රේමයේ අමා ගඟක් වෙලා

සාමයේ මුදුන් කඩක් වෙලා
පූදසුනේ පියුම් බඳුන් (දෙකක්) වෙලා
පූපයයි මිදි රසයි වෙලා
ජීවිතේ අපේ පිදෙයි මෙදා

මිදි විතේ ජේසුගේ ලෙයයි
පූපයේ ජේසුගේ කයයි
එක් වෙලා යාගයක් සදයි
ජේසු ඒ යාගයේ පිදෙයි

දෙවි පියේ ගන්නැ මේ පියුම්
මේ වෙලේ අපේ සිතුම් පැතුම්
ජේසුගේ පිණෙන් පිදෙයි මෙදැන්
ඒ තමා අපේ සැබෑ පැතුම්

## 142 – සමන් පිච්ච

සමන් පිච්ච සුදු අරලිය රෝස ඩේලියා
හිමිදිරි උදයේ පිණිපොද අතරින්
නෙලා ගෙනාවා ජේසු නෙලා ගෙනාවා
ඔබ පුදන්න ජේසු, නෙලා ගෙනාවා

රෝස මලේ පැහය ගෙනා ඔබෙ පහන් බවයි
සුදු අරලිය පෙති අරගත් මුදු මොළොක් බවයි
දෝතින් ගෙන මහද තුළට ළං කර ගනිමී
ඉන් පිබිදී දවස පුරා ඔබ ළග හිඳිමී

හිමිදිරියේ එන පිණිපොද ඔබයි සමිඳුනේ
ඉන් නැහැවෙන සිනිඳු පියලි මමයි සමිඳුනේ
දොරට වඩින ළා හිරු රැස් ඔබයි සමිඳුනේ
එළිය ලබන තිල් තණ මමයි සමිඳුනේ

## 143 – පුංචි අපෙන්

පුංචි අපෙන් නැගෙන සිනා ජේසුට බාරයි
පුංචි අපෙන් වැටෙන කඳුළු ජේසුට බාරයි
පුංචි අපට ලැබෙන ජයත් ජේසුට බාරයි
පුංචි අපේ පාරජයත් ජේසුට බාරයි

පුංචි අපේ දුක් දොම්නස් ජේසුට බාරයි
පුංචි අපේ සැප සම්පත් ජේසුට බාරයි
පුංචි අපේ ගුරු දෙගුරුන් ජේසුට බාරයි
පුංචි අපේ හිත මිතුරන් ජේසුට බාරයි

පුංචි අපේ සිහිය නුවණ ජේසුට බාරයි
පුංචි අපේ හැම සිතුවිලි ජේසුට බාරයි
පුංචි අපට අයිති දෙයත් ජේසුට බාරයි
පුංචි අපේ ජීවිතයත් ජේසුට බාරයි

# 144 – ආදර දෙව් පියේ

ආදර දෙව් පියේ
පිළිගෙන ඔබ මහිමේ
ඔබෙ දරු කැල පුදන පඬුරු //
බාර ගනු මැනේ

ගිරි කඳුරෙන් ඇද හැලෙනා දිය ගඟුලක් සේ
ඔබේ සුසුදු වරම් ජලේ ගලා බසීවා
අප වෙත ගලා බසීවා

යාග පඬුර මඟින් අපේ බැතිය වැඩේවා
ඉමක් නොමැති සදා සැපත අපට ලැබේවා
සම්දුනි අපට ලැබේවා

අප පිය ලන හැම මාවත් එළිය කෙරේවා
වැරදි මඟට නොවැටෙන්නට නැණ පැහැදේවා
නිවැරදි මඟ වැටහේවා

## 145 – හිරු එළියේ පොපියන මල්

හිරු එළියේ පොපියන මල් ඔබට පුදන්න
මහාවැලියේ රන් දියවර ඔබට පුදන්න
අප නිජ බිම රන් මිනි මුතු ඔබට පුදන්න
අවසර දෙනු මැන දෙව්දේ ඔබ පසසන්න

අපේ ශ්‍රමය පුදසුන වෙත අපි ගෙන එනවා
සිතේ සතුට දුක දොම්නස අපි පුද දෙනවා
හද කුටියේ ජනිත හැඟුම් සැම ගෙන එනවා
ඔබේ පහන් වරම් තුලින් අපි සැනසෙනවා

අපේ දිවිය ඔබෙ දිවියෙන් පණ ගැන්වෙනවා
අපේ සවිය ඔබෙ සවියෙන් දිරිමත් වෙනවා
අපේ සිතැඟි ඔබ බැල්මෙන් පිරිපුන් වෙනවා
ලොවේ සියලු දෑ ඔබ'තින් නිති සුරැකෙනවා

## 146 – තෙල් මල් සුවඳ සඳුන්

තෙල් මල් සුවඳ සඳුන්
දෝත පුරා ගෙනෙමින්
බැතියෙන පුදසුන මත තබමින්
පුද දෙමු පඬුරු ලෙසින්

අප මුළු දිවිය පුරා දැරූ දුක් කඳුළු තබා
මේ කුසලාතෙන් ඔබට පුදන්නට
ගෙන එමු පඬුරු ලෙසින්

ලොව යස ඉසුරු දිනා විඳි සුව සතුටු සිනා
යළි ඔබ අතටම නතුකර දෙන්නට
ගෙන එමු පඬුරු ලෙසින්

අප හා අප සතු දේ දෙවිඳුනි ඔබට පිදේ
ඔබ දෙවි බව තුළ පිරිපුන් වන්නට
දෙනු මැන අපට වරම්

## 147 – අපගේ ශ්‍රමයයි

අපගේ ශ්‍රමයයි
පොළොවේ රසයයි
එක්වී සැදුණු මේ සුදු පූපය
ලැබුවෙමු ඔබගෙන් සමිඳේ
මෙය අප සඳහා ජීව දායක
පූප බවට පත්වන මොහොතේ
ඔබ හට පැසසුම් වේවා

අපගේ ශ්‍රමයයි
පොළොවේ රසයයි
එක්වී සැදුණු මේ මිදි රසයද
ලැබුවෙමු ඔබගෙන් සමිඳේ
මෙය අප සැමගේ ආත්ම ශක්තිය
දෙන සිරි රුහිරය වන මොහොතේ
ඔබහට පැසසුම් වේවා

## 148 – මලක සුවඳ

මලක සුවඳ මසිත තුළට දෙන්න සමිඳුනේ
මලක මෙලෙක මහද තුළට දෙන්න දෙව්ඳුනේ
එවිට මලක මෙලෙක සමග සුවඳ සුදු බැවේ
ඔබට පුදමි මහද සමග ම'සිත පඬුරු සේ

දෙව් පියාණනේ දෙව් පියාණනේ
අපගෙ පඬුරු බාර ගන්න, දෙව් පියාණනේ

පූපය මිදියුෂ සමගින ඔබට පිදෙන සේ
මගෙ ගතසිත සමිඳුනි ඔබ නමට පුදන්නේ
පිදෙන පඬුරු දෙව්පුතු සිරුරට හැරෙන ලෙසේ
අසරණ අපවත් පිරිසිදු කරන්න සමිඳේ

හිරුද තරුද සඳුද මුතු මැණික් ද මුලු ලොවේ
රැගෙන ගියද ඔබට දෙන්න මිදිය දෙව්ඳුනේ
දනිති ඔබම මහට දෙන්න හැකි දෙය සමිඳේ
බාර ගන්න මගේ දිළිඳු පඬුර දෙවියනේ

## 149 – සමිඳු වෙතට යා

සමිඳු වෙතට යා දෙව්ඳු වෙතට යා
බැතිය පුරන් පඬුරු අරන් දෙව් වඳිනට යා

සියල් ලොවම එළිය කෙරූ
නිමල දහම් සුව පැතුරූ
නැණ බලයෙන් සත සපිරූ
නිවන සෙවන සැමට පෙරූ

කඳුළු පිරුණු නෙතු වියැලූ
වෙහෙසෙන පා සෙවන සැලූ
මුව්න අමා බස් තෙපලූ
ලොව්තුරු අගයෙන් පෙරලූ

දෙව්ඳු මතය ලොව සපිරූ
පව්තු වහල් දනන් සෙවූ
කරුණා නෙත් ලොවට පෙවූ
නිවන සෙවන සතට මැවූ

## 150 – බාර ගන්නැ දෙව් පියාණනේ

බාර ගන්නැ දෙව් පියාණනේ
බාර ගන්නැ දෙව් පුතාණනේ
බාර ගන්නැ සුදතුන් සුරිඳේ
බබල තියෙක දෙව් සුරාණනේ

ඇරගෙන යමු යමු පඬුරු අපේ
තබනට ඒ ජේසුගේ අතේ
පඬුරු මුවාවෙන් අප දෙන්නේ
අපව මැ, අපේ මැ ජීවිතනේ

ගැහේ ගැහේ හදවත් අපගේ
සමරන විටැ තතු පූජාවේ
ඒ නොවැ අපගේ විස්වාසේ
විස්මෙට කරුණුයි අභිරහසේ

ගතවූවෝ වමු කිතුන් බඳේ
සමරව් පුදුමේ කිතුනුවනේ
සමගි සමාදානේ හවුලේ
එකමුතුවයි පූජා සමගේ

ඔබ හට කැප වී තැලි පෙලි
පොඩි වී පූප බවට පෙරැලි
දිනපතා මැ පූජාසනයේ
ඔප්පු කරමු අප ජීවිතයේ

## 151 - යදිමු දෙව්දුටා

යදිමු දෙව්දුටා මෙ අප පඬුරු පිළිගනු ලෙසටා //

දුබල මිනිස් පුදනා දුබල සතගේ හද වඩනා
දෙව්දු පිදෙන මෙ සුදු පුප පිළිගනු ලෙසටා
යදිමු පිළිගනු ලෙසටා

මිනිස් අපේ සතුට සැපත මිනිස් අපේ දුක් කඳුලුද
මුසුව පිදෙන මෙ මිදි බඳුන පිළිගනු ලෙසටා
යදිමු පිළිගනු ලෙසටා

## 152 – මගේ මහන්සියේ පලයි

මගේ මහන්සියේ පලයි ම'ජේසුනේ මෙදෑ
මගේ මෙ ජීවිතේ හරයි පුදමි දෝත් වැඳෑ
මගේ ලොවේ රජා ඔබයි අනේ ඉතින් මදෑ
මගේ පැතුම් නිගා නොවෙයි පුදමි පියුම් නෙදෑ

මෙ පූ මෙ මී ඔබේ කයයි ලෙයයි සිතේ හොවා
මගේ හදේ බැගෑම වන්දනාව රැව් දෙවා
පියේ ඔබේ වදන් අසා ඇදෙන් උදේ හවා
ම' ජීවිතේ ඔබේ නමින් ම ජීවිතේ වෙවා

## 153 – මොනව ගෙනෙන්නද

මොනව ගෙනෙන්නද මොනව පුදන්නද ඔබ හට දෙව් සමිඳේ
කරුණාවෙන් පිරි ආදරයෙන් පිරි පෙම්බර දෙව් සමිඳේ

පාපි වූ අප අත දුර්වල කම් ඇත ආදර දෙව් සමිඳේ
ඔබගෙන් අප ලද අප ජීවිත සැම ඔබට පුදම් සමිඳේ

පුපය මිදි රස ඔබ හට පුදනෙම් ආදර දෙව් සමිඳේ
අප ජීවිත සැම සලකුනු කර එය ඔබට පුදම් සමිඳේ

අප හැම කැටි කර එකට එකතු කර පුදනෙම් දෙව් සමිඳේ
ඔබේම පුතු වූ කිතු සමිඳුන් අපහට දෙනු මැන සමිඳේ

## 154 – සමිඳු පුදට පඬුරු රැගෙන

සමිඳු පුදට පඬුරු රැගෙන
පුදසුන වෙත පා නගා
දොහොත් මුදුන් දී සදා
පුදමුව සමිඳා සැම දින බැතිනා

සඳුන් කොකුම් තුවරලා
පහන් වැටි ද දල්වලා
මලින් පලින් ගවසලා
පුදසුන සරසා පුදමුව හිමිපා

අපගේ රටද හිමි සඳේ
ජනතාවද ඔබට වේ
හෙළ පොළොවේ උපන් දෑ
ඔබටම සමිඳේ පිදෙතිය තිබඳේ

අප සිතුවිලි සැම දිනේ
එකමුතුකම සමගිනේ
අපගේ වැඩද පඬුරුවේ
ඔබගේ පුදසුනේ එක ලෙස සමිඳේ

පූපය ඔබේ සිරුරටා
මිදියුෂ ඔබේ රුහිරෙටා
හරවති ඔබ සමිඳුනි
අපද ඔබ වෙතේ හරවනු එලෙසේ

## 155 – යාග පඬුර

යාග පඬුර තිළිනයේ
පිදෙයි පඳුන තුති ගොසේ
දුකකි මහත් විඳිනෙමි කියන සඳ පවා
කීවේ දනන් නොපතමි සමිඳු ඇදහිමි

කෙසේ පුදමි තුති පැතුම් කුළුනු සයුරෙනි
නගමි බඳුන ගැලවුමෙ දේව නාමයේ

ගිවිසි ලෙසම ඉටු කරමි දණන් ඉදිරියේ
මරන මොහොතේ සැමගේ සැඳෑ දෙවිඳු අගය වේ

මුදනු මැනව සුයලු බැමින් ඔබගේ දසුවෙමි
පුදන යාගෙ තුති ගොසේ දේව නාමයේ

ගිවිසි ලෙසම ඉටු කරමි දණන් ඉදිරියේ
දෙවිඳු මැදුරේ ජේරුසලෙමේ සැඳෑ වන්නෙමි

## 156 – පිදේ පියේ

පිදේ පියේ සමිඳු බිළිවෙ කුරුසියේ යාගය සේ
හෙළමත යාගයේ පඬුරයි බිළිවෙන පුදසුන මතවේ
පූජිත පූජක වේ

දිව්දෙන උතුමන් රඟනුව බැතියෙන් සමිඳුන් පුදම් පූපයේ
රහස ලෙසේ

සැලෙනා සිරිලෙය පිළිබිඹු කෙරුමට මිදිරස පුදම් පිළිගනු
දේව පියේ

## 157 – සාදුකාර දී

සාදුකාර දී යමු පා ගමතින්
සම්ඳුන් හට පුද පඬුරු අරන්
බැති ගී ගයමින් සදහම් පුරමින්
අප හදවත් සැම ඉරා දමන්

සම්ඳුනි ඔබ වෙත අප එන්නේ
ජනතා වැගුරුම් සමගින්නේ
රූරා හැලෙනා කඳුළු ද ඩා බිඳු වෙහෙස මහන්සිය
ඔබ පුදසුන වෙත ගෙන එන්නේ

සොහොයුරු ගුණ ගරු බව දන්නෝ
එමමුතු මුතු වැල් අමුණන්නෝ
පුදසුන වෙත එන අප නිවැරදි කර පිවිතුරු දිවියේ
දිවි රැල්ලට හසු කර වන්නනෝ

මගේ දෙවියෝ ඔබ මගේ පියා
මගෙ නම කියමින් හඬ ගසනා
ඔබෙ හදවත මගෙ ලැගුම් පළක් කර සදහම් ගමනේ
පියමංකඩ වෙත ගෙන යන්නා

## 158 – සුවඳ සමන්

සුවඳ සමන් මල් අරගෙන
සුවඳ රෝස මල් අරගෙන
පුදසුන වෙත පා නගන්න
අවසර මට දෙන්න සමිඳුනේ //

වෙහෙස වෙලා නෙලා ගත්තු
මල් ටික මා අතේ තිබෙන
ඔබ පාමුල තබා යන්ට
අවසර මට දෙන්න සමිඳුනේ //

මා කළ සිය වැරදි වලට
පව් සමාව දෙනු මැන මට
මලක් වෙලා ළගට එන්ට
අවසර මට දෙන්න සමිඳුනේ //

## 159 – සමිඳුනි ඔබටම

සමිඳුනි ඔබටම ඇප කැප වී – මම පිදෙමි පිදෙමි
සියලු දෙයින් සුසුදු සිතින් – මම පුදමි පුදමි

පිදෙමි සදා පර නොවන මලක් සේ
ඔබෙ මහිමය උදෙසා
පිදෙමි තවද නොනිවෙන පහනක් සේ
ඔබගෙ එළිය පතුරා
රසය බිඳක් හෝ නොඅඩු ලවණ ලෙස
පිදෙමි රසය වගුරා
පිදෙමි පිදෙමි මම පුදමි පුදමි මම
ඔබට කැපව සැමදා

මා සතු සියලුම දේ ඔබගේ බව
හොඳින් හැඳින පුදමි
සඳහට ඔබහට මා ණය ගැති බව
සිතා බැතින් පුදමි
දකුණත දෙන දෙය වම නොදකින ලෙස
ඔබගෙ නමින් පුදමි
රිදෙන තුරුම මම ඔබේ නමට තුති
දෙමි පිදෙමි පුදමි

මගේ සියලු දෙය මගේ සියලු දෙන
මගේ සියලු ආශා
මගේ සියලු දුක සහ සැම සොම්නස
මගේ මුළු දිවිය පුරා
ඔබට පඬුරු ලෙස ඔබට පුදමි මම
හැම මොහොතක් පාසා
ඔබට ඔබටමය දෙවිඳු ඔබටමය
මගේ පිදුම සපුරා

## 160 - දුවන ලෙසට පවසෙ පෙළි පෙළි

දුවන ලෙසට පවසෙ පෙළි පෙළි
මුව දෙන උල් දියට සුසුම් ලා
හැපෙයි මගේ දෙවියනේ
මගෙ අත් බව ඔබමැ සොය සොයා //

වතට වත දිදි දකිම් ඔබ මම කෙදා
දෙවිඳු මගේ සුරිඳු මගේ එකමැ හිමි සඳා

මගෙ පණ වන ඔබට දෙවියනේ
මන දොල මගෙ සයින් තැවෙන්නේ
ලැබෙනු ඇති දැ මට කෙදා
දැකැ ගන්නට මුහුණ දෙව් සදා //

උදේ හවගේ මගේ අහර තේ - ගලන කඳුළු මගේ ඇස් දෙකේ
දෙවියෝ කොහෙදැ දැන් තගේ
ඇනුම් බැණුම් ඇසේ ඇමැ දිනේ //

කොහොම ගියෙම් සෙනඟ සමගෙ'දා බලා මැඳුර දෙවිඳු වඳිනටා
සිහිවන වත එහෙව් දා
හඳ මගෙ යෙයි දැනුත් උතුරලා //

පසස ගැයුම් තුති ගී මැද්දේ - ජය මංගල උදත් නෙ සිරියේ
එදා ගෙවුණෙ කොහොමැදෝ
සිහි වන විට තවමැ හද තැවේ //

ඇයිදැ තවමැ ආත්මයෙණි මේ - දුකට පත්වැ ඉන්නේ වැලැපී
නොසන්හිඳි තැවෙන්නේ - පතා හිඳුව දෙවියන් සරණේ //

## 161 – ජීවන දායක පූපය මේ

ජීවන දායක පූපය මේ
ජේසුගෙ සිරි සිරුරම එය වේ
සමිඳුනි ඔබ දෙන තිළිණ නිසා
ඔබහට නිරතුරු තුති වේවා

මම සැම විට සමිඳුන්ට ප්‍රශංසා කරමි
නිරතුරු මෙම ප්‍රශංසාව මා මුවෙන් රැව්දේ

මාගේ ආත්මය සමිඳාණන් තුළ උදම් අනන්තේය
දුකින් පෙළෙන්නෝ මෙය අසා ප්‍රීති වන්නෝය

මා සමඟ සමිඳාණන්ගේ මහිමය ප්‍රකාශ කරන්න
අපි සැවොම උන්වහන්සේගේ නාමය මහ හඬින් පසසමු

ස්වාමින් වහන්සේ කොපමණ මධුරදැයි රසවිඳ බලන්න
උන්වහන්සේ තුළ රැකවරණය සොයන්නා ප්‍රීතියෙන් පසුවේ

ඔබේ දිව නපුරෙන් රැක ගන්න
ඔබේ තොල් අසත්‍යවූ දෙයින් රැක ගන්න

අයහපතින් ඈත්වී යහපතෙහිම යෙදෙන්න
සාමය සොයා එය අනුව යන්න

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට
දැනුත් සදාකල්හිත් මහිමයම වේවා

## 162 – දයා ප්‍රේමය ඇති තැන

දයා ප්‍රේමය ඇති තැන
දෙවියෝ වැඩ වසනු ඇත

ක්‍රිස්තුස් තුමන්ගේ ප්‍රේමයෙන් අපි හැම දෙන එක්වෙමු
එතුමන් තුළ ප්‍රීතියෙන් සතුටු වෙන්නෙමු
ජීවමාන දෙවිතුමනට හද බැති පෙම් දක්වමු
අවංකවූ හෘදයෙන් එකිනෙකාට ප්‍රේම කරමු

අපි කිසියම් තැනකට එක් රැස් වී සිටිමු ද
එක්සිත් වී සිටිනට ප්‍රවේසම් වෙමු
සණ්ඩු දබර නඩු හබ නොව සාමයෙන් ජීවත් වෙමු
කිතු සමිඳාණන් නිතින් අප වෙතටම කැඳවා ගනිමු

මොක් වැසියන් සමගින ඔබ තේජස දකිනට
කිතු සමිඳුනි අප හට වරය ලැබේවා
තවද කිසිදු අඩුවක් නැති සදා සැපත අප ලැබ
සතත කල්හි සගසැප මොක් පුරයේ අපි විඳිමුව

## 163 – දක්වන ඔබ

දක්වන ඔබ මගෙ ඉතා
කුඩා බැයකුට දයා
ඒ කරන්නේ මට තමා //

සිටියෙම් මම හාමතේ ඔබ මා කැව්වේ
සිටියෙම් මම පිපාසේ ඔබ මා පෙව්වේ
ඇතුළුවන්නැ දැන් මගේ පියාගෙ රජයට සගේ – දක්වන...

සිටියෙම් මම නිරුවතේ ඔබ ම පෙරෙව්වේ
සිටියෙම් මම ලෙඩ ඇඳේ මට'බ සැලකුවේ
ඇතුළුවන්නැ දැන් මගේ පියාගෙ රජයට සගේ – දක්වන...

සිටියෙම් මම මහලු වී ඔබ මා සැලකූ
සිටියෙම් සොවගින් තැවී ඔබ මා සැනසූ
ඇතුළුවන්නැ දැන් මගේ පියාගෙ රජයට සගේ – දක්වන...

සිරගෙයි මම සිටියෙම් ඔබ මා බැලුවේ
තනිවී මම සිටියෙම් ලැබුනි සැනසිලි
ඇතුළුවන්නැ දැන් මගේ පියාගෙ රජයට සගේ – දක්වන...

## 164 – අල්ප වූනට කරන සේවෙ

අල්ප වූනට කරන සේවෙ
සුළු වූවත් මට කළේ

කුසගිනින් පෙලුණෙම් අහර බොදුන් ඔබ දුනී
එන්න මගේ පියාණගේ නිවස තුලට දැන්

පිපාසයෙන් තැවුණෙම් පැණින් විතක් ඔබ දුනී
එන්න මගේ පියාණගේ නිවස තුලට දැන්

ගෙයක් නැතිව ලතවූනේ ඔබයි සෙවන සැපයුවේ
එන්න මගේ පියාණගේ නිවස තුලට දැන්

අඳිනු නොලැබ සැගවුනී වතින් කඩක් ඔබ දුනී
එන්න මගේ පියාණගේ නිවස තුලට දැන්

වෙහෙස දැනෙයි මහත් සේ සුවක් දෙනුව වෙර දැරී
එන්න මගේ පියාණගේ නිවස තුලට දැන්

දුකින් පෙලෙම් සැම දිනේ සහන වන්නෙ ඔබ බැවින්
එන්න මගේ පියාණගේ නිවස තුලට දැන්

නුගතැයි හෙළා දකින් අවැසි නුවණ ලැබ දුනී
එන්න මගේ පියාණගේ නිවස තුලට දැන්

තනිව ලතව සිටියෙම් ඔබ වී මිතුර ලැදි බවේ
එන්න මගේ පියාණගේ නිවස තුලට දැන්

ලෙඩින් දුකින් පසුවෙම් සහය වන්නේ ඔබ බැවින්

එන්න මගේ පියාණගේ නිවස තුළට දැන්

රැකෙන මගක් නැති වුනි එයට සෙතක් ලැබ දුනී
එන්න මගේ පියාණගේ නිවස තුළට දැන්

## 165 – පණතක් මම

පණතක් මම ඔබට දෙම් – පෙම් දක්වනු සැමට නිතින්
මා කලසේ නිති දිනයේ – පණ පුදම් කුරුස ගසේ

දයාම වන්නේ ඉවසීමයි
සැම හට දක්වන ආදරයයි
හදවත් පිබිදෙන කරුණාවයි
ගුණවත් ගතියේ ජීවනයයි

දයාව ඇති තැන උඩගු නොවේ
සිතුදේ කලදෙහි උදම් නොවෙයි
නොහොබින සැමගති ඉවත දමයි
ඉසිකෝ දුර්ගුණ සිඳ බිඳ ලයි

දයාව සැමහට කමා කරයි
නිසිදේ කෙරෙහි සතුට වඩයි
තම තම ලාබය සොයා නොයයි
සාමය සැමවිට ළඟා කරයි

දයාව වන්නේ ඇදහීමයි
ආසිරි වඩවන මතු දැක්මයි
වරදක් නොදකින තුටු බැල්මයි
හොඳ හිත නොබිඳෙන සුබ වදනයි

## 166 – කිතු දෙටු සොහොයුරු

කිතු දෙටු සොහොයුරු පෙරටුව යන්නේ
කුරුසිය ගෙන අපි අනු යම්නේ
මුසු කර අප ඩහදිය සිරි ලෙයටා
වෙහෙසෙමු එක දරු කැල ලෙසටා

බර උසුලන වෙහෙසෙන සත හදටා
සැනසුම සිසිලස දෙන ලෙසටා
වදනින සේවෙන් මේ බව පෙන්නා
දෙනුවට දෙව් පුතු ජනිත වූනා

මව් මරි හට හා සූරුකි පියන්ටා
නිවසෙහි නිරතුරු සහය වූනා
අව් වැසි නොතකා සැරි සරමින්නේ
කුරුසිය තෙක් දහඩිය වගුලේ

කිතු තුම සමගින අපි මෙහෙ කරමු
රට දැය වෙනුවෙන් වෙහෙස වෙමු
ලොව ගලවන්නට ඩහදිය හෙලමු
දෙව් පෙම ඉවසුම ගරු කරමු

## 167 – අප ගැනැ මඳකුත් නොතකා

අප ගැනැ මඳකුත් නොතකා
කැපවී ඔබ සඳහා
ගෙවනට අප දිවි සමිඳේ
අප සිත් පහදන්නේ

අප හට ඔබ සමිඳේ නෑ මැනැලා දුන්නේ
ගැනැ ගැනැ නෑ දෙන්නේ සේවය ඔබට අපේ
තුවාල ගැන නොසිතා අප දිවි පවා පුදා
සේවයේ යෙදෙමු නොබා කුරුසේ හෙවණ ලබා

නිවාඩුවක් නොසොයා සැප පහසුව දුරැලා
අප මුළු දිරිඳ යොදා කරමුව වැඩ ප බෙදා
මහන්සියක් නොබලා පිළි ලබයක් නොපතා
කොතෙකුත් වැඩ කැරැලා හෙම්බත් උණත් හොඳා

ඔබගේ ආසාවේ හැටියට අප සේවේ
කළ බව දැනුනොත් ඒ ඇති අප සිත් සැනහේ
ඔබ මගෙ අත අල්ලා ගෙනැ යනු මට මග පා
ඔබගේ සුරතෙ බලේ දෙනු අප හට සමිඳේ

## 168 – දෙවියෝ වෙති සුළ මූල ප්‍රේමේ

දෙවියෝ වෙති සුළ මූල ප්‍රේමේ
සුළ මූල ප්‍රේමයේ වෙති දෙවියෝ
ගැවැසෙන්නෝ කවුරුද ප්‍රේමේ
ඔවුන් කෙරේ දෙවියෝ
තිවහන් ගත වන්නෝ

ඉවසන සුලු වේ කොතෙකුත් ප්‍රේමේ
ප්‍රේමය උල්පත කරුණාවේ
ඉරිසියාව එහි නැ ආවිලෙන්නේ //
තමාට නැ පාරාට්ටු කරන්නේ

උඩගුව හෙම නැ එහි ලියලන්නේ
හිතු මනාපෙට නොමැ හැසිරේ
තම කම මුලින් මැ උපුටාලන්නේ //
ඇවිස්සෙන්නේ නැ කොපෙන් ප්‍රේමේ

නපුරු කමක් නැ හිතේ පැහැවන්නේ
අනුන් වරද ගැනැ සතුටු නොවේ
හරි කොයි දේටත් සතුට වඩන්නේ //
සියල්ල සතුටින් උහුලා ගන්නේ

ඇදැහිලිමත් සිත නොසිඳේ නොසිඳේ
බලාපොරොත්තුව නොබිඳෙන්නේ
ඉවසීමට හෝ කෙළවරක් නැතේ //
ප්‍රේමය කිසිදා නැ වියැකෙන්නේ

ඇති වුවත් වර දිවැස් දෙසීමේ
ගැඹුරු රහස් සපුරා දැනුමේ

තම සිරුර දවා කෙරුවත් පූජා //
ඒ මොන පලකට ප්‍රේමය සුන්දා

## 169 – පිපස නිවා ගන්න

පිපස නිවා ගන්න අපට ඔබේ ලෙය ලැබේ
හදට අහර ලෙස අගනා සිරුර'පට ලැබේ
සවස දිවා රැයේ තිබෙන පූජේ සුදු ඔබේ
එළිය ලොවට බෙදන ලෙසට යදි අද සබේ

සුරිඳු දෙවිඳුනී තිලෝ රජිඳුනී
පෙමක මහිමෙනී අපට ඔබ දුනී

නිවන ගන්න ලෙස ඔබ පැමුණුන විට හදට
දවන හදේ පෙම්ගිනි නොහැකිය නිවන්නට
කවන අහර දුබල දනට නිතර ලබනට
පවන දිගේ එවනු සවිය තපුරෙ සටනට

නිවස ඔබේ රුවට පෙනේ මිනිස'ප අතරේ
දවස අපේ ඔබ ලැබුනින් ආසිරින් පිරේ
පහස දැනේ සතුට ලැබේ ඔබතුම ඇසුරේ
විගස අනේ සරණේ ඔබේ දෙන්න අප කෙරේ

ඔබට එක්ව සදා සැපත ලබා ගනිම්නා
සතුට මුසුව හද තුල ඔබ ලබා නිති දිනා
සැමට ඔබේ දෙව් විමනේ සැපත පතම්නා
එන්න පිහිට සුහඳ සමිඳ දෙන්න සැම දිනා

## 170 – මගෙ ජීවනයම

මගෙ ජීවනයම ඔබවේ
ඔබ මගෙ රැකවරණය වේ
ගැලවුම් මාර්ගය සත්‍යය ඔබමයි
සැබැවයි සමිඳේ සැබැවයි

ආවේ ජීවනයම දෙන්නයි වැඩි වැඩියෙන් දෙන්නයි
සැමකල දිරිදෙන ඔබ බලයයි මගේ දිවි ඔබ නතු වෙයි
ඔබ ඇති අය වෙත ජීවනයයි නැති අය වෙත මරණේ
නොබියව නොසැලි සිටිනට සැම කල්
කැඳවනු මගේ නම කියලා

ජලයේ මැදිනා යන කලටා ඇත මට ඔබ පිහිටා
මැදිනා යන කල මහ ගංගා නොගලයි මා උඩිනා
ගිනි මැද යන කල මා නොදැවේ
ගිනිදැල් නොම ඇවිලේ
ඔබ මගේ දෙවි වේ බිය සැක නොදැනේ
තුතිවේ සමිඳේ තුති වේ

සව්ලෝ සතුනට සෙත දෙන්නයි
කිතු සිත පතුරන්නයි
ජීවන ජලයෙන් නහවන්නයි රැකවරණය දෙන්නයි
ගැළැවුම් මාර්ගය සලසන්නයි
පිළිතුර ඔබ වෙන්නයි
ම'පැතුම එය වේ ඔබ ඉටු දෙව්වේ
තුති වේ සමිඳේ තුති වේ

## 171 – දවසක දූවිලි

දවසක දූවිලි පසට හැරේ
පසද ගලට පෙරලේ
දවසක ගලකින් මැණික් සැදේ
දහමේ සිරිත මෙයයි

දූවිල්ලෙන් මැණිකක් සැදේ
මඩෙන් නෙළුම් මතුවේ
බෙලි කටුවෙන් මුතුවක් සැදේ
කටු අග මල් පිබිදේ

එලියෙන් රැය දවසට පෙරලේ
මැණිකට ගලක් හැරේ
හැම දෙයටම සුහ මොහොතක් ඒ
ඔබටද එය පැමිණේ

අද ගල් බිම හෙට මල් බිම වේ
මල් බිඳු පැණි බිඳු වේ
පැණි බිඳු බිඳු මී වදයක් වේ
සෝබා දහම මෙයයි

## 172 – කුමක් කමුද කුමක් බොමුද

කුමක් කමුද කුමක් බොමුද අඳිමුදැයි කියා
ලතැවී ඉන්නෙ මන්ද සොයුර පියෙක් ඇත බලා

කුරුළු රංචු කැදලි කරා පියාසර කරයි
කැම පතා අටුකොටුවල රැස් කර නොතබයි
මානෙල් මල් කෙතෙහි පැළඳි ළස්සන කිදිමයි
සරසවන්න නූල් කැටුවෙ කවුරුද පුදුමයි

උසින් වියත කැමති ලෙසට ලබා ගත නොහේ
හිසේ වර්ණෙ සිතූ ලෙසට වෙනස් කළ නොහේ
සැකය ඇයිද දරුවකු වෙත අසහනය දැනී
ඔබට පියෙක් ඇත සගයේ ආදරෙන් පිරි

මෙලෝ සැපත මවත ධනය විනාසෙට ඇදෙයි
දෙවිඳු සතුට සොයා යන්න සියළු දෙය ලැබෙයි
නපුරු පියන් තම දරුවනට සුවසෙත සලසයි
කරුණාබර සගේ පියා ඔබම සොයා එයි

## 173 – කඳුළු විලේ මේ

කඳුළු විලේ මේ අපි පින් සැරියෝ
දුගී මගී වමු අසරණයෝ
නික්මැ යනුත් තේ පාළු කරේ මේ
වනු ඔබ අප ජීවිතෙ පූපේ

නිවාගන්න බෑ මෙලොවැ පිපාසේ
ඕනෑ අපට දිවමත් පානේ
මතකයි පෙවූ සැට් ගලට ගසා පැන්
පොවන්නැ අප ඔබේ හද පාරා

## 174 – දහසක් අතරින්

දහසක් අතරින් මා තෝරා ගත්තාවූ සම්බුදුනි ඔබ හට
නිරන්තරේ බැති ගී ගයන්නෙමි තුති ගී ගයන්නෙමි

අඳුරින් පිරි ලොව එළිය කරන්නට දැල්වෙන පහනක් වී
දෙව් ජනතාවම ඔබට ගෙනෙන්නට
අවියක් වන්නට මා අවියක් වන්නට මා

දෙව් ජනතාවම රස ගන්වන්නට පොළවේ ලවණක් වී
දෙව් ජනතාවම ඔබට ගෙනෙන්නට
අවියක් වන්නට මා අවියක් වන්නට මා

දුක් ගිනි දරනා මේ ලෝ දන හට සැනසුම් සුවයක් දී
දෙව් ජනතාවම ඔබට ගෙනෙන්නට
අවියක් වන්නට මා අවියක් වන්නට මා

වැදුමට පිදුමට වහල් නොවන්නට ඔවුනට පහදා දී
දෙව් ජනතාවම ඔබට ගෙනෙන්නට
අවියක් වන්නට මා අවියක් වන්නට මා

දිවියේ සියලුම අගය බලන්නට සැම හට මග පහදා
දෙව් ජනතාවම ඔබට ගෙනෙන්නට
අවියක් වන්නට මා අවියක් වන්නට මා

## 175 – එන්න මා වෙත

එන්න මා වෙත එන්න මා වෙත
පිපාසෙන් ඔබ පෙළේ නම්

යමෙක් මා අදහා ගනිත් නම්
ජීව ගංගා ඔහු තුළින් ඒ

වෙහෙස වෙත බර උසුලනා අය
එන්න මා වෙත මෙන්න සැනසුම

මගේ වියගහ කර තබා ගෙන
බැගෑ සත් ගති දැක උගන්වා

මිදුම් මග වෙමි නිවන් සෙත වෙමි
නොනසිනා ජීවනය මම වෙමි

කිසිත් නොබියව දිරි වඩන්වා
මෙලෝ සතුරන් දුනිමි පරදා

## 176 – නිල් තණ ගොල්ලේ

නිල් තණ ගොල්ලේ මා සතපන්නෝ
සමිඳු එඬේරාණෝ
ආදර මුවිනේ වදන් සමන් මල්
මා හද පුබුදු කෙරේ //

දෑසම නොපියා නොනිදා සමිඳා
පා ලිස්සීමට නොම දෙයි කිසිදා //
ගලවයි නපුරෙන් යන එන මග මා
පැතුම් හැමට මගෙ ඔබ ඉටු දෙවිඳා

නිල් දිය අසලින් සිසිලක් දෙන්නයි
දඬු සැරයටියෙන් සැනසුම දෙන්නයි //
මා හිස තෙල් ගා පත උතුරා යයි
බිය වන්නේ නෑ ඔබ මා සමගයි

සමිඳුගෙ දකුණ'ත සෙවන සදනවා
සිටිමි සැදී මම බලා සිටිනවා //
සන්තක කර හැම මග මා එනවා
මෙමට සතුට ඔබ වෙතම තිබෙනවා

## 177 නෙතට නොපෙනී

නෙතට නොපෙනී මිනිසි මාගේ
සැඟවී ඉන්නේ දෙවිඳුනේ
හරිම ආසයි ඔබ දකින්නට
මගේ මැසසින් දෙවිඳුනේ
සාදා ආදරයේ ///

කියන්නට මට බොහෝ දේවල්
හිතෙනවා දෙවි සමිඳුනේ
හදේ ගිනිදැල් සුසුම් කඳුලැලි
ඔබ දනී මගේ දෙවිඳුනේ
සදා ආදරයේ ///

මගේ සුහද වූ මිතුරු මිතුරියෝ
වැටී දෙදණින් දැත් යදී
පිහිට   ඔබගේ සුහද දෝතින්
දෙන්න සමිදේ මේ දිනේ
සදා ආදරයේ ///
බලා සමිඳුනි හෙළ පුතුන් ඔබ
ගෙවන ජීවය මේ දිනේ
අඩන අම්මට තැවෙන පිය හට
දෙන්නැ සහනය සමිඳුනේ
සදා ආදරයේ///

මගේ  පවුලේ සැම දෙනාටම
පිහිට වෙන්න’ප සමිඳුනි
ඔබට දහසක් පින් කියන්නෝ
ඔබමැ දරුවෝ මේ දිනේ
සුහද සමිදාණෝ ///

ආදරේ කිරි සාගරේ  ලොව
ඔබයි  මගේ එක දෙවිසුරෝ
ඔබට පින් දෙමි වැටී වදිනෙමි
දකින  තෙක් ඔබ මගෙ නෙතින්
සුහද  සම්දානෝ

## 178 ප්‍රේමය පතමු

ප්‍රේමය පතමු ප්‍රේමය විඳිමු ප්‍රේමය බෙදමු
අපි එක් වී //

ඔබ හද මා වෙත මගේ හද ඔබ වෙත
සිටිනට නිති දිනයේ
අප හද එක සේ සිටිනට තිසි සේ
යොදවමු ප්‍රේම බලෙ

ඔබ විඳිනා දුක මගෙ වෙයි නෑ සැක
සැමදේ එකට පෙනේ

මගෙ එක පණතයි එය සැම කලටයි
ප්‍රේමය පෙන්වන්න
ඉසිකෝ වෛරහැර සාමය ඇති කර
සැම දෙන පිළිගන්න

## 179 අප ගලවා ගැනුමට

අප ගලවා ගැනුමට මේ ලෝ වැඩි බව
සිරි සිරුරෙන්ම  අප පෝෂ්‍ය කෙරු බව
සියහි කර උදම් වෙමින් ඔබ පසසන්නෙමු
ජය ජය වේ තුති මංගල වේ//

සම්දුන් තිවහනේ එතුමන් පසසන්න
තිල්වන්  තුඹ කුසෙහි එතුමන් පසසන්න
බලවත් ක්‍රියා සම්දුන්ගේ පසසන්න
තේජවත් මුනිගේ මහ'තුම් බව පසසන්න

හොරණෑවේ  මහ'ඩින් එතුමන් වනනු
වීනාවේ තත් මැද ඒ ගුණ ගයනු
රබන් නදට මුනිඳුන් පසසා නටනු
තතින් තතට වයමින්  සුසිරය පිඹිනු

මහ හඬ  නංවා අත්තාලම් ගසනු
කිංකිණි හඬවා අත්තාලම් ගසනු
හුස්ම තිබෙන මෙලෝ සතුනි  එකතු වෙනු
විශ්ම ජනක මුනිඳුන් පැසසුම් කරනු

## 180 කොපමණ රස වෙතිදෝ

කොපමණ රස වෙතිදෝ සම්දෝ
දනිව් බලා එතුමා
කොතෙකුත් රස විඳැලා, විඳැලා
දනිව් බලා එතුමා

හිමිපාණන් මම් හැම කල දවසේ
සිටිම් පසස පසසා
එතුමන් වරුණේ ඇත මගෙ දෙතොලේ//
සදාකාලේ තිස්සේ

උදමින් පිපෙමින් හිමි සඳුන් කෙරේ
මගෙ අත් බව තුසිතේ
බැගෑ සිතැත්තෝ අයා නමා කන් //
සතුටු සිතින් දැපෙනෝ

සිටයිව් වනා හිමිපාණන් මහිමේ
මා හ ා එකතුවැලා
පසසමු අපි හැම සබා සමුළු වී //
එතුමන් නමට නමා

හෙව්වා හෙව්වා මා හිමිපාණන්
පිළිතුරු මට ලැබුනා
මගේ සියලු තුති ගැන්විමේදි //

බලන්නැ එතු මන් දෙසැ නෙත් විදහා
උදුලින් පිපී පිපී
මුහුණ ඔබේ හෙම නැ යහැකිළෙන්නේ //
ලජ්ජාවට පත් වී

## 181 වෙමි මම මිදි වැල

වෙමි මම මිදි වැල පවසමි ඉඳුරා - මිදි වැල මමයි හැබෑ
මිදි උයනේ පාලකයෝ - වෙති මගේ පියාණනෝ

ඇඳෑ ඇඳෑ සිත්තම් ලකරින උපමා
දෙසූහ ලොව්තුරු දහම් ඔබේ
ඒ සුබ අස්නේ දිවමත් වචනේ
දුවයි දුවයි ලෝ සතර අතේ //

මා තුළැ ඇති හැම අතු පල නොදරන
දමනු ලැබේ එකිනෙක සිඳලා
පල දරනා අතු පැහැ පැහැ දමනෝ
පල වැඩි වැඩියේ දෙනු සඳහා //

මම වෙමි මිදි වැල, ඔබ එහි අතු වෙති
කවුරුද මා හා එක් වන්නේ
පල දරනු ඇතේ ඉබොහෝ හෙතෙමේ
ලබමින් නිතොරවැ මා ජීවේ //

නොහැකිය කිසිවක් ඔබහට කරනට
නොමැතිවැ මා හා එකට බැඳී
ඇතිනම් ඔබ තුළැ වචනේ මාගේ
ඔබ ඉල්ලන හැම දෙයක් ලැබේ //

සම්දේ මේ උපමාවෙ කතා වේ - ගැඹුර අරුත් තොරා දෙන්නේ
කිතුනුවනේ ඒ අප ජීවිතයේ - පරමානන්දේ වියැ යුතුවේ //

කිඳැවී ඔබෙ හද ඇතුළට කිඳැවී - තේරුම් ගන්නට දෙනු සම්දේ
සුදතුන් දැණන් වරම් ප්‍රසාදේ - ගනවූවෝ අපි කිතුන් බදේ

## 200 - කුසගිනි වෙමි

කුසගිනි වෙමි මා සමිඳේ
දිව බොදුනින් සතපනු මැන
පිපාස වෙමි මා සමිඳේ
දිව රුහිරෙන් පොවනු මැනවී

මහ කතරේ සාගින්නේ
ඔබේ පුතුන් මොර දෙන සඳ
එ හඬ අසා අහස පලා
මන්නා දුන් දෙවි සමිඳේ

ජීවය දෙන බොඳුන මමයි
ඔබ කීවා මට මතකයි
කුස ගිනි මා නිවනු මැනවී
ඔබගේ ජීවන බොඳුනින්

ජීවන ජල උල්පත මම
ඔබ කී සැටි මට මතකයි
පිපස මගේ නිවනු මැනවී
ජීවන උල්පත් ජලයෙන්

## 211 සමිඳේ ඔබේ කූඩාරමේ

සමිඳේ ඔබේ කූඩාරමේ සරිසරන්නෝ කවුරුදෝ
ඔබේ පිවිතුරු කඳුකරේ පා තබන්නෝ කවුරුදෝ

හිතේ කිළුටක් නැතිවැ හැසිරෙන්නෝ
යුක්ති සහගත දෙයට හිත දෙන්නෝ
නොවක් හිතෙකින් ඇත්ත පවසන්නෝ
අනුන් අවමන් දිවෙන් නොකියන්නෝ

සොහොයුරන් හට නපුර නොපතන්නෝ
අනුන් හොඳ නම කිළිටි නොකරන්නෝ
සියලු දුසිරිත් කෙරෙන් දුරුවන්නෝ
සුසිරිතට නිරතුරුවැ හිත දෙන්නෝ

මුදල් දී ගිහි පොලී නොකරන්නෝ
අල්ලසක් ගෙන අනුන් නොපෙළන්නෝ
අහිංසකයන් පෙළා නොතළන්නෝ
නිදොස් අය පිටැ වරද නොතබන්නෝ

කුරිරුවන් අත දුරින් දුරලන්නෝ
සමිඳු ජන බුහුමතින් සලකන්නෝ
සමිඳු බාරය පැහැර නොහරින්නෝ
මෙබඳු අය මැයි වාසනා ලද්දෝ

## 213 නැත මට තනියක්

නැත මට තනියක් නැත මට හිඟයක්
සමිඳුන් මා ළඟ සිටින තුරා
නැත මට සතුරන් ඇත මට මිතුරන්
සමිඳුන් මා ළඟ සිටින තුරා

ගමන් කරන්නට මගක් නැතිව මට
දහස් වාරයක් ළතවී සිටි මම //
යායුතු ඒ මග ක්‍රිස්තුනි ඔබ බව
ඔබ හමුවීමෙන් අත් දැක්කෙමි මම

ජීවත් වුවද සමාජයේ මම
හද තුළ මිරිකී මිය ගොස් සිටි මම //
හද පිරි සතුටින් එකමුතු කමකින්
ජීවත් වෙමි දැන් ඔබ හමු වූ මම

මගේ හදවත පැලී ඉරී තැලිලා ඇත
සුවය ලබන්නට ආවෙමි ඔබ වෙත.
මොර දුන්නෙමි මම අඳුරේ සිටගෙන
ඔබ විය ආලෝකය මගේ දිවියට

## 271 සාමයේ ජීවිත මග

සාමයේ ජීවිත මඟ වෙත
මා යොමු කළ මැන ස්වාමිනේ
ජාතිය කුලය නිසා නොබෙදී
මානව බැතියෙන් එකමුතුවී
රටතුළ සමගිය ගොඩ නංවන්නට
දෙන්නැ වරම් ඔබගේ //

සමිඳේ අප ගුරු දෙවිඳේ
ඔබේ සැබෑ දහම් මගේ
පිය නංවමු තිබඳේ

ප්‍රේමයේ ජීවිත පිලිවෙත
දිරි ගන්වනු මැන ස්වාමිනේ
මුදු කරුණා ගුණයෙන් තෙත් වී
මෙත් මුදිතාවෙන් පිරිපුන් වී
මනු සත් වගට මෑ සෙත් සලසන්නට
දෙන්නැ වරම් ඔබගේ //

සේවයේ ජීවන මං පෙත
එළිකර දෙනු මැන ස්වාමිනේ
පීඩිතයන් සිත සැනසුම දී
නැති බැරි අයහට අත හිත දී
ජන සෙත උදෙසා ඇප කැප වන්නට
දෙන්නැ වරම් ඔබගේ

## 279 අඳුරු ලොවක් මත

අඳුරු ලොවක් මත ආලෝකය ඔබ වේ
සම්දුනි අපහට කරුණා කළ මැනව

පාප බරින් අප දෙනෙත වැසී පියැවේ
ක්‍රිස්තුනි අපහට කරුණා කළ මැනව

බියෙන් දුකින් අප සිත නිති දිත මැලවේ
සම්දුනි අපහට කරුණා කළ මැනව

## 281 කමා කළ මැනේ

කමා කළ මැනේ සුරිඳුනි – කමා කළ මැනේ
අප හැම කළ වැරදි වලට – කමා කළ මැනේ

අසීමිත වූ ඔබේ පෙමට – නිගරුව පිටුපා
නොමඟට ගිය අපහට වෙනු – මැන අනුකම්පා

සිතිත් කයිත් වදනිත් රුදු – පවට නැඹුරු වී
සොහොයුරු පෙම පලුදු වුණේ – සාමය කඩ වී

## 285 සුරලොව දෙවිඳුට

සුරලොව දෙවිඳුට මහිමය හිමි වේවා
දනාට මිහි මත සාමය හිමි වේවා.
දෙව් හිමි පාණෙනි සුර රජිඳාණනි පුත්බල දෙවිඳුපියේ
අපි ඔබ නමදිමු තුති දෙමු පසසමු ඔබේ මහිමය සඳහා
ජේසු ක්‍රිස්තු හිමි පියතුමගේ හුදු දරුවූ
දෙව් හිමියෙනි දෙවිඳුගේ බිළි යාගෙනි
ලෝ පව් දුරලනුයේ ඔබය.
අප වෙත කරුණා කළ මැනවී
හිඳිනිය ඔබ පියතුමගේ දකුණේ
අප ඇයැදුම පිළි ගත මැනවී
හුදු ඔබ පමණිය  සුදු වනුයේ
ඔබ පමණිය සමිඳා
ඔබ පමණිය හුදු අති උතුමා.
ජේසු ක්‍රිස්තු සුදු සුසුමත් හා
දෙව් පියතුමගේ මහිමේ වැඩ හිඳිනා. ආමෙන්.

## 289 – මහිමේ උස් මණ්ඩලේ

මහිමේ උස් මණ්ඩලේ සුරිඳුන්හට අයත්වේ
සුදනන් හට මිහිපිටේ සන්හිඳීම අයත් වේ

අපි ඔබ පසසන්නමෝ ඔබේ ගුණ ගයන්නමෝ
අපි ඔබ නමදින්නමෝ මහිම තෙද වනන්නමෝ

ඔබේ මහ මහිමය සදා අපි පින් දෙමු ඔබ පුදා
අහෝ සුර රදාණනේ සකල බලැති දෙවිඳුනේ

අහෝ ජේසු සමිඳුනේ දිනු එක් සුතාණනේ
දේව බැටළුවාණනේ පිය සඳුන් සුතාණනේ

ලෝ පව් හරුවාණනේ අපට දයා වුව මැනේ
ලෝ පව් හරුවාණනේ යැදුම'ප පිළි ගනු මනේ

පිය දකුණෑ හිඳින්නනේ අපට දයා වුව මනේ
ඔබම හේලිවන තිසා ඔබම සමිඳු වන තිසා

ජේසු කිතුනි ඔබමැ හා හේලි සුදන් සුරිඳු හා
දෙව් සුරුපිය සඳුන් හා මහිමයෙන් උතුම් ම හා

ඒ එසේමැ වේ.

## 293 සගෝ දෙව්දූතට

සගෝ දෙව්දූතට මහිමය වේවා
මෙලෝ සුසිතුනට සාමය වේවා.

දෙව් සමිඳුනි සුර රජාණනි
සියලු බලැති දෙව් පියාණනි

අපි ඔබ පසසමු ඔබ ගුණ වනමු
නමදිමු මහිමය පලකරමු

ඔබ සතු මහා මහිමේ නිසා
ඔබ හට නිති තුති පුද කරමු

ඒක ජනිත පුත් ජේසු සමිඳුනේ
දේව බැටළු පොව්වාණනේ

ලෝ පව් දුරලන කිතු සමිඳේ
පිළිගනු මැන මේ යැදුම අපේ

වැඩ වසනා ඔබ පිය දකුණේ
අප හට කරුණා කරනු මැනේ

සුදතුන් සමගින් දෙව් පිය මහිමේ
නිති වැඩ වසනා ජේසු සුරිඳුනේ

ඔබ පමණය පිරිසුදු වනුවෝ
ඔබ පමණය සමිඳෝ
ඔබ පමණය අති උතුමෝ. ආමෙන්.

## **322** – රොනට වදින

රොනට වදින බිඟු ඔබයි – කැකුළු මල මමයි
මලට සුවඳ ටික ඔබයි – සිඟිති පෙති මමයි

ජේසු දෙවියනී, ජේසු දෙවියනී

විලට වසින පිණි ඔබයි – පද්මිනිය මමයි
සුළඟ සළන සිරි ඔබයි – ලලිතිනිය මමයි

පහන් දොරට හිරු ඔබයි – කුමුදිනිය මමයි
රැයට දිලෙන හඳ ඔබයි – හඳට රැය මමයි

දියට මුහුද දෙවි ඔබයි – ගලන ගඟ මමයි
දිගත පතල ජල ඔබයි – නගින රළ මමයි

## 379 පැතිබර වන මල්

පැතිබර වන මල් අතුම්ණි දැදිරිව
පිතිබර හිමිදිරියේ
මල් ලොවැ රැජිණිය ඔබ බව පවසයි
ලෝක දයාබරියේ
මිහිකත වටකොට සත්මහ සමුදුර
සෝදන දිය සරියේ
ඔබමය රැජිණිය ඔබමය රැජිණිය
ඔබමය මව් මරියේ

මල් ලොවැ මංගලියේ
ලෝක දයාබරියේ
ලෝ කිරිටය ඔබෙ හිස මත තබමින්
නමෝ නමෝ මරියේ

පව් බර අප වෙත මව් පෙම් වඩවා
කරුණා නයන හෙලා
දිරි ගන්වනු මැන අප සිත් දින දින
ඔබෙ පුත් රුවන බලා
නිති සරණය දෙන මරි මව කඩ නොව
නංවන අසිරිවලා
රැජිණිය රැජිණිය සලසනු රැජිණිය
අප වෙත එන්න ගලා

## 421 රිදී වළා ගැබින් නැගෙන

රිදී වළා ගැබින් නැගෙන කුමරි කව්රුදෝ
අඹරේ දිනිඳු වතසෙ දිලෙන මුහුණ කාගෙදෝ
කුළුණු බරින් කඳුළු සැලෙන දෙනෙත කාගෙදෝ
කොමළ මුවින් මා සනසන රැජිණ කව්රුදෝ

දේව දිනිති ඒ දෙව් කුමරිය ඒ
සමිඳු දාසි ඒ සගයේ රැජිණ ඒ
මල් කුමාරි ඒ හෙළ රැජිණිය ඒ
දේව මෑණි ඒ අපේ අම්මා ඒ

මිසර දෙසට කුමරු රැගෙන ගියේ කව්රුදෝ
කුරිරු රජුගේ අතින් ජේසු මිදුවේ කව්රුදෝ
මෙහෙළ බිමට අප රකිනට වැඩියේ කව්රුදෝ
කියනු කියනු හෙළ වැසියෙනි එතුම් කව්රුදෝ

# සාමය වෙනුවෙන් යාඥාව - 194

## අසීසියේ සාන්ත ප්‍රැන්සිස් මුනිඳුන්ගේ සාමයේ යැදුම

ස්වාමිනි, මා ඔබගේ සාමයේ උපකරණයක් කළ මැනව.
වෛරය පිරුණු තැනට ප්‍රේමය ද,
අසමගියේ තුවාලයන්ට ශාන්තියේ සුවය ද,
අවිශ්වාසයෙන් යුත් තැනට විශ්වාසය ද,
බලාපොරොත්තුව සුන් තැනට බලාපොරොත්තුව ද,
ශෝකය වටලා ගත් තැනට ප්‍රීතිය ද,
ගෙනයාමට වරම් දුන මැනව.
දිව්‍ය ගුරුතුමාණෙනි,
සැනසීම ලැබීමට වඩා සැනසීම දීමට ද,
තේරුම් ගනු ලබනවාට වඩා තේරුම් ගැනීමට ද,
ප්‍රේමය ලැබීමට වඩා ප්‍රේම කිරීමට ද,
මා යොමු කළ මැනව.
මක්නිසාද දීමෙන් ලැබීමත්,
සමාව දීමෙන් සමාවත්,
මරණයෙන් අපට සදා ජීවිතයේ ඉපදීමත් අත්වන හෙයිනි. ආමෙන්.

